# රණවිරුවා

2023 ජුනි ● 256 කලාපය



## ඒතෙර මෙහෙයට යන මෙතෙර අභිමානය

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර

# අකුරු කරන දරුවන්ට විරු දෑතින් සෙවණක්



යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල, ඉලුක්පිටිය ප්‍රදේශයේ පිහිටි ඉලුක්පිටිය කනිෂ්ඨ විද්‍යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකරදීමේ කටයුතු ඉකුත් ජූනි 16 වන දින ආරම්භ කෙරිණ.

එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මහතා සමගින් විදුලිබල හා බලශක්ති අමාත්‍ය කාංචන විජේසේකර මහතා, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු පිරිසක් සහභාගී වූහ.



කොළඹ රාජකීය විද්‍යාලයේ ආදිශිෂ්‍ය සංගමයේ (1981 කණ්ඩායම) ජ්‍යේෂ්ඨ සාමාජිකයකු වන අමන්ද වීරසිංහ මහතාගේ සම්බන්ධීකරණයෙන් එම ආදිශිෂ්‍ය සංගමය විසින් මෙම දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට ඉදිරිපත් වී ඇත.

ඉලුක්පිටිය කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පතිගේ ඉල්ලීමකට අනුව යුද්ධ හමුදාධිපති ලබාදුන් උපදෙස් මත අධ්‍යක්ෂ ජෙනරාල් ඉංජිනේරු සේවා මේජර් ජෙනරාල් කේඑම්එස් කුමාර ගේ මගපෙන්වීම යටතේ 12 ඉංජිනේරු සේවා බලකා රෙජිමේන්තුවේ භටපිරිස් මෙම ව්‍යාපෘතිය ආරම්භ කළහ.



එහිදී, එම පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 192 දෙනකුගේ අධ්‍යාපන කටයුතු සඳහා දිරිගැන්වීමක් වශයෙන් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක්ද පාසල් ප්‍රධාන ශාලා පරිශ්‍රයේදී පවත්වනු ලැබීය. ඒ සඳහා කොළඹ රාජකීය විද්‍යාලයේ ආදිශිෂ්‍යයකු මෙන්ම දානපතියකු සහ සමාජ සේවා ක්‍රියාකාරිකයකු වන ප්‍රසාද් ලොකුබාලසූරිය මහතා අනුග්‍රාහකත්වය දක්වනු ලැබීය.







# අනුරාධපුර රෝහල වෙත රුධිර කාන්දුපෙරණ යන්ත්‍රයක්

එවකට උතුර හා නැගෙනහිර පළාත්වල පැවති සටන්වලදී දහස් ගණන් හමුදා සහ සිවිල් ජන ජීවිතවලට සත්කාර කරමින් අනුරාධපුර ශික්ෂණ රෝහල විශාල කාර්යභාරයක් ඉටුකරන ලදී. එමෙන්ම, යුද පෙරමුණේදී බරපතල තුවාල ලැබූ සෙබළුන්ගේ හදිසි ප්‍රතිකාර සඳහා උදාර සේවයක් ලබාදුන් හමුදාවට සුවයදෙන නිවහනක් වූ අනුරාධපුර ශික්ෂණ රෝහලේ වකුගඩු ප්‍රතිකාර ඒකකයට රුපියල් ලක්ෂ 33 ක් වටිනා රුධිර කාන්දු පෙරන යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම ඉකුත් ජූනි 04 වන දින සිදුකෙරිණ. ගරු ආරක්ෂක ලේකම්ගේ මාහැඟි අදහසක් මත ආරම්භ කරන ලද "සඳහිරු සෑය පුණ්‍ය භාරය" හරහා මෙම උදාර කර්තව්‍යයට අරමුදල් සම්පාදනය කරන ලද අතර, එම අරමුදල් යොදාගනිමින් සිදුකරන ලද පළමු පරිත්‍යාගයද මෙය විය. මෙම අවස්ථාවට රජරට විශ්වවිද්‍යාලයේ කුලපති, රුවන්වැලි සෑ විහාරස්ථානාධිකාරී, රාජ්‍ය නිලධාරීන් හා හමුදා ප්‍රධානීහු රැසක් සහභාගී වූහ.



# අනුරපුරයේ පොසොන් කලාපය

දේශයේ උදාරතර රණවිරුවන් හට ඉහළම උපහාර පිරිනමමින් වාර්ෂිකව පැවැත්වෙන විශේෂ පොසොන් භක්ති ගීත වැඩසටහන මෙවරද ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 03 වන දින සන්ධ්‍යාවේදී සඳහිරු සෑ පරිශ්‍රයේදී පැවැත්විණ.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා සභාපතිනි චිත්‍රාණි ගුණරත්න මහත්මිය, 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, හටකාර්ය සම්පාදන අණසක ආඥාපති, අධ්‍යක්ෂ ජෙනරාල් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු ඇතුළු හමුදා සාමාජිකයින්, පාසල් සිසුන් සහ බැතිමතුන් විශාල පිරිසක් සහභාගී වූහ.

# විශ්‍රාම දිවියට පා තබන ගුවන් හමුදාධිපතිට සුබ පැතුම්





විශ්‍රාම දිවියට පා තබන ගුවන් හමුදාධිපති එයාර් මාර්ෂල් එස්කේ පතිරණ ඩබ්ලිව්ඩබ්ලිව්වී (දෙවරක්) ආර්ඩබ්ලිව්පී (දෙවරක්) ආර්එස්පී (සිව්වරක්) වීඑස්වී යූඑස්පී එම්එස්සී (එම්ඕඑච්) යූඑස්ඒ එම්එස්සී (ආරක්‍ෂක අධ්‍යයන) කළමණාකරන, එම්ෆිල් (ඉන්දියා) එම්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී (ඉන්දියා) පීඑස්සී කිව්එෆ්අයි ඉකුත් ජූනි 26 වන දින යුද්ධ හමුදාධිපති හමුවිය. යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවති මෙම හමුවේදී ක්‍රියාන්විත රාජකාරීන්හිදී ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සිදුකළ කැපවීම, යුද්ධ හමුදාව සහ ගුවන් හමුදාව අතර පවතින සහයෝගීතාවය ඇතුළු කරුණු රැසක් පිළිබඳව සාකච්ඡා කෙරිණි. එම හමුව සමාප්තියේ යුද්ධ හමුදාධිපති සහ විශ්‍රාම ලබන ගුවන් හමුදාධිපතිතුමන් අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදුවිය.





## අභාවප්‍රාප්ත මේජර් ජෙනරාල් පීඩබ්ලිව්බී ජයසුන්දර (විශ්‍රාමික) ගේ දේහයට හමුදා ගෞරවාචාර පිදේ





වසර 34 කට අධික කාලයක් රට වෙනුවෙන් විශිෂ්ට සේවයක නිරත වූ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අභාවප්‍රාප්ත මේජර් ජෙනරාල් පීඩබ්ලිව්බී ජයසුන්දර වීඑස්වී යූඑස්පී එන්ඩීසි යූඑස්ඒසීජීඑස්සී අයිජී (විශ්‍රාමික) ගේ දේහය පිළිබඳ අවසන් කටයුතු යුද්ධ හමුදා ගෞරවාචාර මධ්‍යයේ බොරැල්ල පොදු සුසාන භූමියේදී ඉකුත් ජූනි මස 12 වන දින සන්ධ්‍යාවේ සිදුකෙරිණි. ආරක්‍ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද ආදාහනාගාරය වෙත පැමිණ අභාවප්‍රාප්ත ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත ගෞරවාචාර පුදකළේය.

යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු නැවත ක්‍රියාකාරී සේවයට කැඳවා ඇති එම ජ්‍යෙෂ්ඨ නිලධාරි අභාවප්‍රාප්ත වනවිට ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂ ධූරය හොබවමින් සිටියේය. සිය වෘත්තීය දිවිය තුළ එතුමන් යුද සේවා ලේකම්, යුධෝපකරණ මාස්ටර් ජෙනරාල්, සැලසුම් අධ්‍යක්ෂ, 52, 21 සහ 51 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපති ලෙසද තනතුරු හොබවා ඇත.



# යුද්ධ හමුදාධිපති ප්‍රශංසාත්මක ලාංඡනයෙන් පිදුම් ලැබූ වගයි




වකුගඩු ආශ්‍රිත හටගත් ලොව විශාලතම සහ දිගම ගල (Calculus) ඉවත් කර ගිනස් වාර්තා අතරට එක්වූ කොළඹ යුද්ධ හමුදා රෝහලේ මොත්‍ර ලිංගික පද්ධති අංශ (Genito Urinary Unit) ප්‍රධානී ලුතිනන් කර්නල් (වෛද්‍ය) කේ සුතර්ෂන් වෙත ඉකුත් ජුනි 14 වන දින "යුද්ධ හමුදාධිපති ප්‍රශංසාත්මක ලාංඡනය" හිමිගැන්විණ. යුද්ධ හමුදාධිපති ගේ සුරතින් යුද්ධ හමුදා මූලස්ථානයේදී මෙම පදක්කම ප්‍රදානය කළ අවස්ථාවට එම සැත්කමට දායක වූ සෙසු කාර්ය මණ්ඩලයටද ආරාධනා ලැබ තිබිණ.

රෝගියාගේ ජීවිතයට හානියක් නොවන අයුරින් එම විස්මිත සැත්කමට දායක වූ එම සියලුදෙනා වෙත එහිදී යුද්ධ හමුදාධිපති ගේ ප්‍රශංසාව හිමිවිය. ඉකුත් ජුනි 01 වන දින කොළඹ යුද්ධ හමුදා රෝහලේදී සිදුකළ මෙම ශල්‍යකර්මයට මොත්‍ර රෝග විශේෂඥ වෛද්‍ය ලුතිනන් කර්නල් කේ සුතර්ෂන් ගේ ප්‍රධානත්වයෙන් කපිතාන් (වෛද්‍ය) ඩබ්ලිව්පීඑස්සී පතිරත්න සහ වෛද්‍ය තමාෂා ප්‍රේමතිලක දායක වූ අතර, ඒ සඳහා නිර්වින්දන වෛද්‍යවරු ලෙස කර්නල් (වෛද්‍ය) යූඑල්ඩී පෙරේරා සහ කර්නල් (වෛද්‍ය) සීඑස් අබේසිංහ ද එක්වූහ.

එහිදී, ඉවත්කළ ගල සෙන්ටිමීටර 13.372 ක දිගකින් සහ ග්‍රෑම් 801 ක බරින් යුක්තය. ගිනස් ලෝක වාර්තාවට අනුව, ලෝකයේ මේ වනවිට හමුවී ඇති දිගම වකුගඩු ගල (Calculus) වර්ෂ 2004 දී ඉන්දියාවේදී කරන ලද ශල්‍යකර්මයකදී හමුවී ඇති අතර, එය සෙන්ටිමීටර 13 ක් දිගින් යුක්ත විය. බරින් වැඩිම වකුගඩු ගල වර්ෂ 2008 දී පාකිස්ථානයෙන් හමුවී ඇති අතර, එය ග්‍රෑම් 620 ක් ලෙස සඳහන් වේ.







# වර්ෂ පූර්ණ පදවිප්‍රාප්තිය සමරා
## ආශිර්වාද එක්කෙරේ

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට නායකත්වය ලබාදෙන වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සිය ධුරයට පත් වී 2023 ජූනි මස 01 වන දිනට වසරක් සම්පූර්ණ විය. ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රබලතම මහජන කැලඹිලිකාරී තත්වයක් පැවති අභියෝගාත්මක අවස්ථාවකදී යුද්ධ හමුදාධිපති වශයෙන් රාජකාරී භාරගෙන එම තත්වය මැඩපැවැත්වීම සඳහා යුද්ධ හමුදාවට නිසි මගපෙන්වමින් හා නායකත්වය ලබාදෙමින් රටතුළ යහපත් වාතාවරණයක් උදාකිරීම සඳහා එතුමන් විශිෂ්ට කාර්යභාරයක් ඉටුකරන ලදී. එසේම, එය ජාත්‍යන්තරයේ පවා පැසසුමට ලක්විය. තවද, ගතවූ කාලසීමාව තුළ එතුමන්ගේ මූලිකත්වයෙන් යුද්ධ හමුදාව තුළ සිදුකළ ගුණාත්මක මෙන්ම ධනාත්මක වෙනස්කම් රැසකි. ඒ හරහා ලද කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිඵල වර්තමානයටද අනාගතයටද එක සේ ප්‍රයෝජනවත් දැවැන්ත ආයෝජනයක් වැනිය.

විශේෂයෙන්ම එතුමන්ගේ සංකල්පයක් මත සිදුකළ යුද්ධ හමුදාව ප්‍රතිව්‍යුහගත කිරීම, මානව සම්පත් සහ මූල්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් හඳුන්වාදීම, යුද්ධ හමුදාධිපති ප්‍රශංසාත්මක ලාංඡනය පිරිනැමීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම යනාදී අංශ රැසකද විශාල සාර්ථකත්වයක් ලබා ඇත. තවද, සාමසාධක මෙහෙයුම් සඳහා යුද්ධ හමුදාවේ සක්‍රිය දායකත්වය ඉදිරියේදී තවදුරටත් ලබාගැනීම සඳහා සැලසුම් සකස් කිරීමද විශ්‍රාමික හමුදා සාමාජිකයින්ට විදේශයන්හි රැකියා අවස්ථා ලබාගැනීම උදෙසා බිම්බෝම්බ ඉවත්කිරීමේ පාඨමාලාව හඳුන්වාදීමද එතුමන්ගේ මැදිහත්වීම මත සිදුවීම කැපීපෙනේ. මීට අමතරව, ආපදා කළමනාකරණ කටයුතු සඳහා යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සක්‍රිය දායකත්වය ඉහල නැංවීමද දැක්විය හැකිය. එසේම, වැඩි දියුණු කරන ලද පරිගණක මෘදුකාංග යෙදවුම් හඳුන්වාදීමෙන් යුද්ධ හමුදාවේ තාක්ෂණික දියුණුව සඳහාද පියවර ගෙන ඇති අතර, එමඟින් යුද්ධ හමුදාව සතු සම්පත් රටේ ආර්ථික දියුණුව සඳහා යෙදවීමටද හැකි වී ඇත. නවීන අංගෝපාංගවලින් සමන්විත යුහමු වෙබ් අඩවිය එළිදැක්වීමද නීතිවිරෝධී මත්ද්‍රව්‍ය මැඩලීම සම්බන්ධව හා  බුද්ධි ආවේක්ෂණ මෙහෙයුම් ක්‍රියාත්මක කරලීමේදීද වැඩි යුද හමුදා දායකත්වයක් ලබාදීමද එතුමන්ගේ මගපෙන්වීම යටතේ සිදුකරන ලද තවත් ප්‍රමුඛ කාර්යභාරයකි.

තවද, ගතවූ වසර තුළ සෙබළුන්ගේ සුභසාධන කටයුතු සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග රාශියකි. මහනුවර හමුදා රෝහලේ සංවර්ධන කටයුතු කඩිනම් කිරීම, "නවලෝක විරුසුව සරණ ප්‍රසාද කාඩ්පත" හඳුන්වාදීම මෙන්ම සොල්දාදුවන්ගේ ආර්ථික අපහසුතා හඳුනාගෙන ඊට විසඳුම් ලබාදීමට ක්‍රියාකිරීමද එහිදී ප්‍රධාන වේ. එසේම,  යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරී නියුතු සෙසුනිලයින් සඳහා තලාහේන ප්‍රදේශයේ නේවාසිකාගාරයක් විවෘත කිරීම, අත්තිඩිය මිහිඳුසෙත් මැදුරේ "මිහිඳු ආයුර්වේද සුවඅරණ" විවෘත කිරීම මෙන්ම නවීන පහසුකම්වලින් සමන්විත යුද හමුදා පුස්තකාලය විවෘත කිරීමද කැපී පෙනේ. එමෙන්ම දේශීය කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම, ආහාර සුරක්ෂිතතාව සඳහා හරිත කෘෂිකර්ම මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කිරීම. යුද හමුදා ගොවිපලවලින් නෙලාගනු ලබන අස්වනු ඉඳුරාම යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා යොදවාගැනීමත් අතිරික්තය රජයේ ව්‍යාපාති හරහා රටේ සාමාන්‍ය ජනයා හට ලබාදීමේ ජාතික වැඩපිළිවෙලක් ආරම්භ කිරීමත් එතුමන්ගේ සෘජු අධීක්ෂණය යටතේ සිදුවූ තවත් මාහැඟි මෙහෙවරකි. යුද්ධ හමුදාවේ මූලික අවශ්‍යතාවන් යුද්ධ හමුදාව තුළම නිෂ්පාදනය කිරීමේ වැඩපිළිවෙලක්ද අරඹා රණවිරුවන්ගේ තාක්ෂණික හා නිර්මාණාත්මක හැකියාවන් වැඩිදියුණු කරලීම වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගද වත්මන් යුද්ධ හමුදාධිපතිතුමන්ගේ වසරක මෙහෙවරෙහි සන්ධිස්ථාන ලෙස සටහන් කළ හැකිය.



යුද්ධ හමුදාධිපතිගේ වසරක පදවිප්‍රාප්තිය වෙනුවෙන් ආශිර්වාද එක්කිරීමේ ආගමික වැඩසටහනක් යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී පසුගිය ජූනි 01 වන දින උදෑසන පැවැත්විණ. එහිදී, කෝට්ටේ රජමහා විහාරයේ විහාරාධිපති පූජ්‍ය අලුත්නුවර අනුරුද්ධ නාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය "සෙත් පිරිත්" සජ්ඣායනා සිදුකොට ආශිර්වාද එක්කළහ.



මෙම අවස්ථාවට තවත් වටිනාකමක් එක්කරමින් යුද්ධ හමුදාධිපති සහ සේවා වනිතා ඒකකයේ සභාපතිනිය විසින් යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරී කරන ගැබිනි කාන්තා සෙබළියන් වෙත පෝෂණ ආහාර සලාක පාර්සල් බෙදාදෙමින් ඔවුන් වෙත දිවාභෝජන සංග්‍රහයක්ද පිළිගන්වනු ලැබීය.





# මාලි මෙහෙයට යන විරුවෝ
# යුද්ධ හමුදාධිපති වෙත ගෞරවාචාර පුදකරති

මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායිභාවය ඇති කිරීමේ මෙහෙයුම් මුලස්ථානයේ (MINUSMA) එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් සඳහා දිවයිනෙන් පිටත්වීමට නියමිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා 5 වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම (Combat Convoy Company) ඉකුත් ජුනි 23 වන දින අඹේපුස්සෙහි ස්ථාපිත ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මුලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාර පිරිනැමීය. මෙම අවස්ථාවට සපැමිණි ප්‍රධාන ආරාධිත අමුත්තාව උපකරණ මාස්ටර් ජෙනරාල් සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය.







දිවයිනෙන් පිටත්ව යාමට නියමිත ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයින් මූලික කොටගත් 5 වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමට ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය, ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා සංඥා බලකාය, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව නියෝජනය කරන නිලධාරීහු සහ සෙසුනිලයෝ ද ඇතුළත් වූහ.

නිලධාරීන් 20 දෙනෙක් සහ සෙසුනිලයන් 223 දෙනකු ඇතුළු යුද්ධ හමුදා සාමාජිකයින් 243 දෙනකුගෙන් සමන්විත 5 වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමේ අණදෙන නිලධාරී ලෙස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කර්නල් ඩබ්ලිව්ඩබ්ලිව්එන්පී වික්‍රමාරච්චි කටයුතු කරනු ලබයි. දෙවන අණදෙන නිලධාරී ධුරය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ මේජර් එම්ඒඩී බණ්ඩාරනායක විසින් හොබවනු ලබයි.

මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායිභාවය ඇතිකිරීමේ මෙහෙයුම් මූලස්ථානයේ (*MINUSMA*) මේ වනවිට සේවයේ නිරතව සිටින 4 වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම සිය රාජකාරීන් ජූලි මස 01 දින 5 වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම වෙත භාරදීමෙන් අනතුරුව යළි දිවයිනට පැමිණීමට නියමිතව ඇත.

මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති ඇතුළු නිලධාරීන්, සෙසුනිලයන් සහ 5 වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමේ සාමාජිකයන්ගේ ළඟම ඥාතිහුද සහභාගී වූහ.



# සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ දිවියට සවියක්



යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මූලිකත්වයෙන් වියළි ආහාර සලාක පාර්සල් 483 ක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූනි මස 21 වන දින පැවැත්විණ. යුද හමුදා මූලස්ථාන පරිශ්‍රයේ පැවති මෙම වැඩසටහනට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූහ.

මෙම වැඩසටහනේදී සහල්, පරිප්පු, සීනි, කිරිපිටි ආදියෙන් සමන්විත වියළි ආහාර සලාක පාර්සල් පරිත්‍යාග කෙරුණු අතර මෙලෙස බෙදා දෙන ලද සම්පූර්ණ වියළි සහ නැවුම් ආහාර පාර්සල් තොගයේ වටිනාකම රුපියල් මිලියන 1.2 ක් විය. මෙම වැඩසටහනට සමගාමීව නෙස්ලේ ලංකා පුද්ගලික සමාගමේ අනුග්‍රාහකත්වයෙන් එම සිවිල් සේවක මහත්ම මහත්මීන් වෙත රුපියල් මිලියන 3.7 ක වටිනාකමකින් යුත් පොල්කිරි පැකට් පරිත්‍යාගක්ද සිදු කෙරිණි. මෙම උත්සව අවස්ථාව සඳහා නෙස්ලේ ලංකා පුද්ගලික සමාගමේ නියෝජිතයින්, මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්ද එක්වූහ.












# නවීකරණය කළ යුද්ධ හමුදා වෙබ් අඩවිය එළිදැක්වේ

රටේ ජනප්‍රියම ආරක්ෂක වෙබ් අඩවිය වන *www.army.lk* වෙබ් අඩවිය නව මුහුණුවරකින් නවීකරණය කර ඇත. එය මේ වනවිට සියලු තොරතුරු සමගින් යාවත්කාලීන කර ඇති අතර, සීඝ්‍රයෙන් වෙනස් වන තාක්ෂණයත් සමග භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි මෙම නව වෙබ් අඩවිය එළිදැක්වීය. අලුත්වුණු යුද්ධ හමුදා වෙබ් අඩවිය සහ "සෙබළ සිතිවිලි" ඊ සඟරාව යුද්ධ හමුදා ජනමාධ්‍ය අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් ඉකුත් ජුනි මස 15 වන දින සන්ධ්‍යාවේ එළිදක්වන ලදී. එම අවස්ථාව සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික, ප්‍රධාන සංඥා නිලධාරී මෙන්ම යුද්ධ හමුදා ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයෝ රැසක්ද සහභාගී වූහ.

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ මෘදුකාංග ඉංජිනේරුවන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව අඩුපිරිවැයකින් යුතුව වසර 10 කට පසු සම්පූර්ණයෙන්ම යාවත්කාලීන කරන ලද මෙම නව වෙබ් අඩවිය පරිශීලනය කරන්නන්ට යුද්ධ හමුදාවට අදාළ බොහෝ තොරතුරු දැනගැනීමේ හැකියාව පවතී. එසේම, "සෙබළ සිතුවිලි" ඊ සඟරාව හරහා හමුදා සාමාජිකයින්ගේ නිර්මාණාත්මක හැකියාවන් ඔප්නංවා ගැනීමේ ඉඩකඩද සලසා ඇත.

මේ වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ක්‍රියාත්මක වන ප්‍රාථමික රාජකාරි, එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි, පුහුණුවීම්, සිවිල් - හමුදා සම්බන්ධීකරණ ව්‍යාපෘති, සුබසාධන ව්‍යාපෘති, ක්‍රීඩා, සේවා වනිතා ආදී කරුණු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම වෙබ් අඩවිය තුළින් එළිදක්වනු ලබයි.

නව වෙබ් අඩවිය නවීකරණය කාර්යය සඳහා ප්‍රධාන සංඥා නිලධාරී සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ඇතුළු ශ්‍රී ලංකා සංඥා බලකායේ තොරතුරු තාක්ෂණ විශේෂඥයෝ රැසක් දායකත්වය දැක්වූහ. *www.army.lk* නිල යුද්ධ හමුදා වෙබ් අඩවියට අමතරව සියලුම යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සහ සිවිල් වැසියන්ගේ පරිශීලනය උදෙසා යුද්ධ හමුදා මූලස්ථානයේ ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් දෛනික ප්‍රවෘත්ති පුවත්පත, *Defenders of the Nation* ෆේස්බුක් පිටුව, *SL Army YouTube* නාලිකාව සහ *Twitter* ඇතුළු අනෙකුත් සමාජ මාධ්‍ය ජාලා මෙන්ම ප්‍රවෘත්ති විකාශයන් ද ඉදිරිපත් කරනු ලබයි.




# විජයබාහු පාබල රෙජිමේන්තු වර්ණ ප්‍රදානෝත්සවය







විජයබාහු පාබල රෙජිමේන්තුව වෙතින් නෙවන වරටත් සංවිධානය කරනු ලැබූ "වර්ණ ප්‍රදානෝත්සවය -2023" ඉකුත් ජූනි මස 23 වන දින කුරුණෑගල, බෝයගනේ ස්ථාපිත විජයබාහු පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණි. එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී විය.

එහිදී, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ හිමිකරගැනීම සඳහා විජයබාහු පාබල රෙජිමේන්තු ක්‍රීඩකයින් දිරිගැන්වීමේ අරමුණින් 2018 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ අන්තර් රෙජිමේන්තු, ආරක්ෂක සේවා, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ හිමිකරගත් විජයබාහු පාබල රෙජිමේන්තු ක්‍රීඩකයින්ගේ කුසලතා ඇගයීමට ලක්කරමින් ඔවුන් වෙත වර්ණ ප්‍රදානය කරනු ලැබිය.



ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් මෙරටට කීර්තියක් අත්කර දෙමින් ක්‍රීඩා ඉසව් 44 ක් නියෝජනය කරමින් විශිෂ්ට දක්ෂතා දැක්වූ එම රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයන් ඇතුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් 262 දෙනකු වෙත එහිදී වර්ණ ප්‍රදානය සිදුකෙරිණ.



මෙම අවස්ථාවට සමගාමීව, විජයබාහු ක්‍රීඩකයින්ගේ ක්‍රීඩා කුසලතා ප්‍රවර්ධනය කරමින් අනාගත ජයග්‍රහණ ලබාගැනීම වෙනුවෙන් දිරිගැන්වීමක් වශයෙන් යුද්ධ හමුදාධිපතිගේ සුරතින් එම රෙජිමේන්තු ක්‍රීඩා අරමුදල වෙත රුපියල් මිලියනයක මුල්‍ය දිරිගැන්වීමක් ප්‍රදානය කිරීමද විශේෂත්වයකි. මෙම වර්ණවත් උත්සව අවස්ථාව සඳහා විජයබාහු පාබල රෙජිමේන්තුවේ නිලධාරීන්, සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

# නයිජීරියානු යුද්ධ හමුදා දූත පිරිසක් යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක



නයිජීරියානු යුද්ධ හමුදාවේ පුහුණු හා මූලධර්ම අංශයේ අණදෙන නිලධාරී මේජර් ජෙනරාල් එස්ඕ ඔලබන්ජි (Major General SO Olabanji) ගේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත පිරිසක් ඉකුත් ජූනි මස 07 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවූහ. මෙම සුහද හමුවේදී දෙරටෙහි පුහුණු වැඩසටහන් හුවමාරු කරගැනීම සහ පුහුණු අභ්‍යාසයන් පැවැත්වීම පිළිබඳව වඩාත් පුළුල් ලෙස සාකච්ඡා කෙරිණ.

යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවති මෙම සුහද හමුව සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්වී ආර්එස්පී පීඑස්සී සහ අධ්‍යක්ෂ ජෙනරාල් පුහුණු මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී ද සහභාගී වූහ.

# මහජන චීන සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි

මහජන චීන සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නව ආරක්ෂක උපදේශක ජ්‍යෙෂ්ඨ කර්නල් සවු බෝ (*Senior Colonel Zhou Bo*) ඉකුත් ජූනි මස 19 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය. මෙම සුහද හමුවේදී, ද්විපාර්ශ්විකව වැදගත්වන කරුණු පිළිබඳ අවධානය යොමුකෙරිණි. විශේෂයෙන්ම එහිදී දෙරටේ ත්‍රිවිධ හමුදාවන් අතර පවතින සුහදතාවය, දිගුකාලීන බැඳීම් හා අඛණ්ඩ සහයෝගීතාවයේ වැදගත්කම පිළිබඳව කරුණු අවධාරණය කළේය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා වන විශේෂ පුහුණු වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ හැකියාව පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.



# බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශකයෝ යුද්ධ හමුදාධිපති හමුවෙති



ධූරයෙන් නික්ම යාමට නියමිත කොළඹ පිහිටි බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්‍ෂක උපදේශක බ්‍රිතාන්‍ය යුද්ධ හමුදාවේ කර්නල් පෝල් ක්ලේටන් (Colonel Paul Clayton) සහ එම ධූරයට පත්වීමට සිටින බ්‍රිතාන්‍ය යුද්ධ හමුදාවේ කර්නල් ඩැරන් වුඩ්ස් (Colonel Darren Woods) පසුගිය ජූනි 01 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවූහ.

මෙහිදී, සිය ධූර කාලය තුළ දෙරටෙහි රාජ්‍ය තාන්ත්‍රික සහ හමුදා සබඳතා ශක්තිමත් කරගැනීම සඳහා කළ කැපවීම වෙනුවෙන් ධූරයෙන් නික්ම යන ආරක්ෂක උපදේශක වෙත සිය කෘතවේදීත්වය පුද කළ යුද්ධ හමුදාධිපති එම ධූරයේ රාජකාරී භාරගැනීමට නියමිත නව ආරක්ෂක උපදේශක වෙතද උණුසුම් සුබපැතුම් පුදකළේය.

දෙරටේ ත්‍රිවිධ හමුදාවන් අතර පවතින සුහදතාව, සහයෝගීතාව සහ අවබෝධය පිළිබඳ සිහිපත් කරමින් ද්විපාර්ශවීය වැදගත් වන පොදු කරුණු පිළිබඳ මෙම සුහද හමුවේදී සාකච්ඡා කෙරුණු අතර, එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් නවදුරටත් වැඩිදියුණු කිරීමේ හැකියාව මෙන්ම විවිධ පුහුණු වැඩසටහන් සඳහා දෙරටේ ත්‍රිවිධ හමුදාවේ සහභාගීත්වය ඉහලනංවා ගැනීම පිළිබඳව ද සාකච්ඡා කෙරිණ.

# සුහද හමුවක මතක සටහන්

ගජබා රෙජිමේන්තුවේ සේවා මුක්ත සංගමයේ ජ්‍යේෂ්ඨතම සාමාජිකයකු වන මේජර් ජෙනරාල් ජීවීඩීයූඒ පෙරේරා (විශ්‍රාමික) ඉකුත් ජූනි මස 15 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය. 2017 අප්‍රේල් මස යුද්ධ හමුදාවෙන් විශ්‍රාම දිවියට එළඹි ගජබා රෙජිමේන්තුවේ ජ්‍යේෂ්ඨ නිලධාරියකු වන එතුමන් යුද්ධ හමුදාවේ මෙහෙයුම්, පරිපාලන සහ පුහුණු කටයුතු වෙනුවෙන් කැපීපෙනෙන සේවයක් ඉටුකර ඇති අතර, කීර්තිමත් අධ්‍යාපනඥයකු හා කථිකාචාර්යවරයකු ලෙසද කටයුතු කර ඇත. මෙම හමුවේදී එතුමන්ගේ වසර 34 කට අධික සේවා කාලය තුළදී යුද්ධ හමුදාවේ විවිධ තනතුරු හා වගකීම් දරමින් සිදුකරනු ලැබූ සේවය සිහිපත් කිරීමෙන් අනතුරුව යුද්ධ හමුදාධිපති විසින් එතුමන් වෙත සමරු තිළිණයක්ද පිරිනමන ලදී.





# අභිමන් ගමනකට උණුසුම් සුබපැතුම්

පසුගියදා උසස්වීම් ලැබූ ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) මේජර් ජෙනරාල් එස්ජී පතිරණ ආර්එස්පී ඉකුත් ජූනි 12 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය. එහිදී, යුද්ධ හමුදාධිපති ගේ සුරතින් එම ජ්‍යේෂ්ඨ නිලධාරී වෙත නිල ලාංඡන පළඳවනු ලැබූ අතර, එම නිලයේ වගකීම භාරදීම සනිටුහන් කරමින් අසිපත් ප්‍රදානය කිරීමද සිදුකෙරිණ.

# පාබල හමුදාවෙන්

## රණවිරු හිසට සෙවණක්







ශ්‍රී ලංකා පාබල හමුදා සාමාජිකයින්ගේ සුබසාධනය වෙනුවෙන් එම රෙජිමේන්තු අධිපතිගේ අදහසකට අනුව ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිකළ නව නිවාස තුනක් පසුගියදා අදාළ සෙනින් වෙත භාරදෙනු ලැබීය. වසර 14 කට අධික නිකැළැල් සේවා කාලයක් සම්පූර්ණ කළ 5 (ස්වෙච්ඡා) ශ්‍රී ලංකා පාබල හමුදාවේ කොමිෂන් නොලත් නිලධාරියකු වෙත එලෙස අභිනවයෙන් ඉදිකළ නිවසක් ඉකුත් ජුනි 08 වන දින භාරදීම සිදුකෙරුණේ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතිනි. 5 (ස්වෙච්ඡා) ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී මේජර් යූඑම්ටීසී ධර්මසිරි ආර්ඩබ්ලිව්පී ගේ මගපෙන්වීම මත එම ඒකකයේ භටපිරිස් මෙම නව නිවස ඉදිකිරීම සඳහා සිය ශ්‍රම දායකත්වය, ඉංජිනේරු සහ තාක්ෂණික දැනුම ලබාදුන්හ.

එසේම, අනුරාධපුර, හොරොව්පොතාන ප්‍රදේශයේ පදිංචි 23 ශ්‍රී ලංකා පාබල හමුදාවේ කොමිෂන් නොලත් නිලධාරියෙක් වෙනුවෙන් වැලිඔය, ඇතාවැටුණුවැව ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ නව නිවසක් භාරදීමද යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජුනි 09 වන දින සිදුකෙරිණ. එහි ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රම දායකත්වය සහ තාක්ෂණික දැනුම 23 ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එන්අයිපීකේ ගමගේ ගේ අධීක්ෂණයෙන් එම ඒකකයේ භටපිරිස් ලබාදෙනු ලැබූහ. වසර 17කට වැඩි සේවා කාලයක් සම්පූර්ණය කළ 8 ශ්‍රී ලංකා පාබල හමුදාවේ කොමිෂන් නොලත් නිලධාරියකු වෙත කළුතර, බණ්ඩාරගම ප්‍රදේශයේ ඉදිකරන ලද නව නිවසක් භාරදීමද ඉකුත් මැයි 26 වන දින සිදුකෙරුණේ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ගේ සුරතිනි. මෙහි ඉදිකිරීම් කටයුතු, තාක්ෂණික හා ශ්‍රම දායකත්වය 8 ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් අයිඒඑල් ඉලේපෙරුම ගේ උපදෙස් මත එම ඒකකයේ භටපිරිස් විසින් ලබාදෙන ලදී.

## ශ්‍රී ලංකා පාබල හමුදා මූලස්ථාන බළඇණියේ සංචාරයක

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති ඉකුත් මැයි 26 වන දින බුස්සේ පිහිටි ශ්‍රී ලංකා පාබල හමුදා මූලස්ථාන බළඇණියේ සංචාරයක නිරත වෙමින් එහි භටපිරිස්වල අවශ්‍යතාවන් සහ බළඇණියේ ඉදිරි සංවර්ධන කටයුතු පිළිබඳව සොයා බැලිය.

එහිදී, එම බළඇණියේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එස්එන් සමරනායක විසින් සිය රෙජිමේන්තු අධිපති උණුසුම් අයුරින් පිළිගෙන කඳවුරේ රාජකාරී ස්වභාවය පිළිබඳවද පැහැදිලි කළේය. එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පාබල හමුදාවේ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් එම්පීඑස්පී කුලසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයෝ පිරිසක් ද සහභාගී වූහ.



# යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී රාජකාරී අරඹයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තෙවන ජ්‍යේෂ්ඨතම ධූරය වන නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි ලෙස මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑස්එස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පසුගිය ජුනි මස 08 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී මහා සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ සිය ධූරයේ රාජකාරී භාරගත්තේය.

වර්ෂ 1987 මාර්තු මස 16 දින කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක - 27 යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳුණු එතුමන් දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය තුළින් මූලික යුද පුහුණුව හදාරා දෙවන ලුතිනන්වරයකු ලෙස අධිකාරියට පත්ව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට එක්ව තිබේ. එතැන් පටන් යුද්ධ හමුදාවේ විවිධ මට්ටම්වල තනතුරු රැසක් දරා ඇති එතුමන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ධූරයද හෙබවූයේය.

මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑස්එස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ වර්ෂ 1988 දී ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය වෙතින් දෙවන ලුතිනන්වරයකු ලෙස අධිකාරියට පත්වන අවස්ථාවේදී එවකට යුද්ධ හමුදාධිපති ධූරය හෙබවූ එතුමන්ගේ පියා වූ ලුතිනන් ජෙනරාල් හැමිල්ටන් වනසිංහ ගේ සුරතින් අධිකාරිය සංකේතවත් කරන අසිපත ලබාගැනීම ශ්‍රී ලංකා හමුදා ඉතිහාසයේ ඉතාමත් දුර්ලභ අවස්ථාවක් වශයෙන් සැලකේ. සිය හමුදා දිවිය තුළ අණ හා මාණ්ඩලික සහ උපදේශක පත්වීම් රැසක් හොබවා සුවිශේෂී හැකියාවන් පිළිබිඹු කර ඇති එතුමන් තිස් වසරකට අධික කාලයක් මෙරට පැවති ත්‍රස්තවාදයට එරෙහි සටනටද සුවිශේෂී දායකත්වයක් දැක්වූ දක්ෂ නිලධාරියෙකි.









# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක රාජකාරී අරඹයි

මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ 51 වන සේනාවිධායක ලෙස ඉකුත් ජුනි මස 09 වන දිනට යෙදුණු සුබ මොහොතින් ස්වේච්ඡා බලසේනා මූලස්ථාන කඳවුරු පරිශ්‍රයේදී රාජකාරී භාරගත්තේය.

එහිදී, එතුමන් වෙත යුද හමුදා සම්ප්‍රදායානුකූල මුර පිරික්සුමක් හා සම්මාන මුරයක් පිරිනමා ගෞරවය පුදකරන ලදී. විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ධූරයද හොබවන එතුමන් මීට ප්‍රථම, යුද්ධ හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ 1 බලකායේ බලකාධිපති ඇතුළු යුද්ධ හමුදාවේ ජ්‍යේෂ්ඨ තනතුරු රැසක් හොබවා ඇති දක්ෂ නිලධාරියෙකි.



# යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය අභිමානවත් 27 වන සංවත්සරය සමරයි





යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය ස්ථාපිත කර වසර 27 ක් සපිරීම නිමිත්තෙන් එහි ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කෙරුණු අභිමානවත් උත්සවයක් ඉකුත් ජුනි 19 වන දින පැවැත්විණ. එහිදී, ආගමික වතාවත් සිදුකිරීම, ආඥාපති වෙත ගෞරවාචාර පිරිනැමීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය එම වැඩසටහන් අතර ප්‍රධාන විය. තවද, සංවත්සර අවසන් අංගය ලෙස සියලු නිලයින්ගේ සහභාගීත්වයෙන් සංගීත ප්‍රසංගයක්ද පැවැත්විණ.

# යාපනය ආඥාපති විදෙස් දූතපිරිස් හමුවේ





ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක කර්නල් ෆ්‍රැන්කොයිස් පිලිප් ගැරෝක්ස් (Colonel Francois Philippe Garraux) සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) නියෝජනය කරන දූත පිරිසේ ප්‍රධාන සේවරින් චාපාස් (Severine Chappaz) හා උප නියෝජිත කණ්ඩායම් ප්‍රධානී ඇලෙක්සැන්ඩර් බුරොව් (Aleksandr Burov) පසුගිය ජුනි 12 සහ 14 යන දිනයන්හි යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ සංචාරයක නිරත වූහ. එහිදී, ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති හමුවූ ඔවුන් යාපනය අර්ධද්වීපයේ යුද හමුදාව සහ සිවිල් ජනතාව අතර සහයෝගීතාවය, සමාජ සුභසාධක ව්‍යාපෘති, ආරක්ෂක තත්වය සහ සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින් සාකච්ඡාවන්හි නිරතවිය.





# ගැබිනි මව්වරුන් සඳහා පරිත්‍යාගයක්

පොසොන් පොහොය දිනයට සමගාමීව ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයේ ගැබිනි මාතාවන් 140 දෙනකු වෙත රුපියල් විසිපන්දාහක පමණ වටිනාකමින් යුත් අත්‍යවශ්‍ය භාණ්ඩ හා උපකරණ කට්ටලය බැගින් බෙදාදීමේ උත්සවයක් ඉකුත් ජූනි 03 වන දින පැවැත්විණ. මෙම කටයුත්ත සඳහා "තායිවානි ථේරවාදී සමාධි බෞද්ධ සංවිධානය" විසින් මූල්‍ය අනුග්‍රහය ලබාදුන් අතර, මෙහි සම්බන්ධීකරණ කටයුතු එම සංවිධානයේ අධ්‍යක්‍ෂක සහ සභාපති වන නගානන්ද විශ්වවිද්‍යාලයේ උපකුලපති ආචාර්ය පූජ්‍ය බෝධාගම චන්ද්‍රිම නාහිමියන් විසින් සිදුකරන ලදී. තවද මෙම උත්සවයට සමගාමීව පැමිණි ගැබිනි මාතාවන් සහ ඔවුන්ගේ ඥාතීන් හට දිවා ආහාරයද ලබාදෙන ලදී. මෙම උත්සවය සඳහා "තායිවානි ථේරවාදී සමාධි බෞද්ධ සංවිධානයේ" තායිවාන් ජාතික සාමාජිකයින් 40 දෙනකු, ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සිඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# දමිළ භාෂා පාඨමාලාව - 06 වන අදියර සාර්ථකව අවසන්







වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති ගේ උපදෙස් පරිදි එම බලප්‍රදේශයේ රාජකාරී නියුතු සෙබළ සෙබළියන්ගේ දමිළ භාෂා කුසලතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් පැවැත්වූ දමිළ භාෂා පාඨමාලාවේ 06 වන අදියර ඉකුත් ජූනි 02 වන දින 1 සන්නද්ධ බුද්ධි බලකායේදී සාර්ථකව අවසන් කෙරිණ. එහි අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එස්ජේකේ සුහසිංහ පීඑස්සී අයිඑස්සී එම්අයි ගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ ලුතිනන් ඒජීඑන් සඳරුවන්, සැරයන් සංජීව ජේජේඑම් සහ කෝප්‍රල් රත්නායක ආර්එම්ආර් යන උපදේශකවරුන්ගේ සහයෙන් පැවති මෙම පාඨමාලාවට සෙසුනිලයෝ 34 දෙනෙක් සහභාගී වූහ. අවසන්දින සහතිකපත්‍ර ප්‍රදානය කිරීම සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) බ්‍රිගේඩියර් (ප්‍රමාණි) බ්‍රිගේඩියර් එස්පීජේ ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී විය.

# නැගෙනහිර ආඥාපති හා නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා අතර හමුවක්



නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී පසුගිය ජූනි 16 වන දින 22 වන පාබල සේනාංකයේ සිදුකළ සිය ක්ෂේත්‍ර සංචාරය අතරතුර නැගෙනහිර පළාත් ආණ්ඩුකාර සෙන්තිල් තොණ්ඩමන් මහතාද හමුවිය. ත්‍රිකුණාමලයේ පිහිටි ආණ්ඩුකාර කාර්යාලයේදී සිදුවූ මෙම හමුවේදී ප්‍රදේශය ආශ්‍රිත ගැටලු පිළිබඳව සාකච්ඡා කෙරිණි.

# නැගෙනහිර ආඥාපති සේරුනුවර විහාරස්ථානයෙන් ආශිර්වාද ලබාගනිමින්

නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති ඉකුත් ජූනි 17 වන දින සේරුනුවර විහාරස්ථානය වැඳපුදා ගනිමින් ආගමික වතාවත්වලටද සහභාගී විය. එහිදී, එම නායක හිමිපාණන් සමග විහාරස්ථානය කේන්ද්‍රකොට ගනිමින් කෙරෙන කටයුතු පිළිබඳ සාකච්ඡාවකද නිරතවිය. මෙම අවස්ථාවට 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 222 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු නිලධාරීහු පිරිසක් ද සහභාගී වූහ.



# නැගෙනහිර ආඥාපති 22 වන පාබල සේනාංකයේ සංචාරයක



නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති ඉකුත් ජූනි 16 සහ 17 යන දෙදින තුළ 22 වන පාබල සේනාංකය යටතේ ඇති බලසේනා සහ ඒකකවල සිය මංගල ක්ෂේත්‍ර සංචාරයේ නිරතවිය. එහිදී, ත්‍රිකුණාමලය ප්ලාන්ටේන් පොයින්ට් හි පිහිටි 22 වන පාබල සේනාංක මූලස්ථානය වෙත පැමිණි ආඥාපති වෙත හමුදා සම්ප්‍රදායානුකූලව හිමිවූයේ ගෞරවණීය පිළිගැනුමකි.

එහිදී, ආඥාපති විසින් හටපිරිස් අමතමින් සෑම තරාතිරකම ඉහළම විනය පවත්වා ගනිමින් යහපත්ව වැඩකටයුතු අඛණ්ඩව කරගෙනයාමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කළේය. තවද, සියලු නිල තේ පැන් සංග්‍රහයකටද සහභාගී වූ හෙතෙම, බුද්ධි නිලධාරීන් සමග බලප්‍රදේශයේ රාජකාරී සබැඳිව සාකච්ඡාවකද නිරතවූහ. තවද, 221,222 හා 223 වන බලසේනා හා ඒ යටතේ ඇති සියලුම ඒකකද ඔහුගේ නිරීක්ෂණයට බඳුන්විය.





# මුලතිව් ආඥාපති සේනාංක සංචාරයක



ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ සිය ධූරයේ රාජකාරි ආරම්භ කිරීමෙන් අනතුරුව ඉකුත් ජූනි 13 වන දින එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ පාලනය වන 57 වන පාබල සේනාංකයේ සිය පළමු සංචාරය නිරතවිය.

එහිදී, කොකාවිල් රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීමෙන් පසු සේනාංකය වෙත පැමිණි ආඥාපති එහි සියලු නිලතේ පැන් සංග්‍රහයකටද එක්විය. තවද, 57 වන පාබල සේනාංකය යටතේ පාලනය වන බලඇණි පුහුණු පාසලෙහි සංචාරයකද නිරතවූ හෙතෙම එහි පුහුණුව හදාරමින් සිටි 6 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් නිලධාරීන් සහ සෙසුනිලයින් ආමන්ත්‍රණය කරන්නටද එක්විය.

## 59 වන පාබල සේනාංක සංචාරයේ මතක සටහන්





ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති සිය ධූරයේ රාජකාරි ආරම්භ කිරීමෙන් අනතුරුව සිය දෙවන සංචාරය ලෙස ඉකුත් ජූනි 21 වන දින 59 වන පාබල සේනාංකයේ සංචාරය කරන ලදී. එහිදී එම පාබල සේනාංකය වෙතින් පිළියෙල කර තිබූ රාත්‍රී භෝජන සංග්‍රහයකට ද හෙතෙම එක්විය.

# අඩු ආදායම්ලාභී පවුලක් වෙත නව නිවසක් පරිත්‍යාග කෙරේ

ජාතිය ගොඩනැගීමේ මෙහෙයට දායකත්වය ලබාදෙමින් 16 ගජබා රෙජිමේන්තුවේ සහ 1 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ හටපිරිස් එකතුව නබ්බෝව, ප්‍රදීපාගම ප්‍රදේශයේ වෙසෙන නිවාස අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් ඉදිකළ නව නිවසක් පසුගියදා විවෘත කෙරිණ. එම අවස්ථාවට ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය.

කලාඔය ප්‍රදේශයේ ස්ථාපිත යුද්ධ හමුදා පුහුණු පාසලේ හිටපු සේනාවිධායක බ්‍රිගේඩියර් ඒඑම්එස් ප්‍රේමවංශ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී (විශ්‍රාමික) ගේ ඉල්ලීමකට අනුව සහන් රාජපක්ෂ මහතා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය මූල්‍ය ආධාර සහ අමුද්‍රව්‍ය සම්පාදනය කරනු ලැබීය. ඒ අනුව, 143 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටීඑම්එෆ් කිව්ලන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය මත 16 ගජබා රෙජිමේන්තුවේ සහ 1 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරීන් විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ලැබූහ.



# බලලත් නිලධාරී සහ සැරයන්වරුන්ට අභිමානවත් නව සෙවණක්





පුත්තලම් ප්‍රදේශයේ පිහිටි 143 වන පාබල බලසේනා මූලස්ථානයේ සේවයේ නියුතු බලලත් නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන්ගේ දීර්ඝකාලීන අවශ්‍යතාවයක් ඉටු කරමින් එම මූලස්ථානයේ අභිනවයෙන් ඉදිකළ බලලත් නිලධාරී සහ සැරයන් නිවස්නය පසුගිය ජූනි 18 වන දින විවෘත කෙරිණ. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා ආඥාපති (බටහිර) සහභාගී විය. මෙම නව බලලත් නිලධාරී සහ සැරයන් නිවස්නය ඉඩකඩ සහිත භෝජනාගාරක්, රූපවාහිනී නැරඹුම් මැදිරියක් සහ විවේක ගැනීම සඳහා විසිත්ත කාමරයකින්ද සමන්විත වේ.








## නව ආපනශාලා සංකීර්ණයක් විවෘත කෙරේ

23 ගජබා රෙජිමේන්තු සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා එම ඒකකයේ සියලුම නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරන ලද ආපනශාලා සංකීර්ණය ඉකුත් මැයි 27 වන දින විවෘත කෙරිණ. මෙම අවස්ථාව සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ සහභාගී විය.

## පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති ගේ පූර්ණ මගපෙන්වීම යටතේ හල්දුම්මුල්ල සොරගුණේ බ/අම්ලගම කණිෂ්ඨ විද්‍යාලයේ දරු දැරියන් වෙත පාසල් උපකරණ, පාවහන් කට්ටල හා කෙටි ආහාර ලබාදීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 17 වන දින එම විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

එම පාසල් ළමුන්ගේ සහ ඔවුන්ගේ දෙමාපියන්ගේ දිවියට කිසියම් අස්වැසිල්ලක් සැලසීමේ උදාරතර පරමාර්ථය පෙරදැරිව සිදුකළ මෙම කටයුත්තට ඇමරිකාවේ දකුණු කැරොලිනා හි නිව් සවුත්වෙල්ස් රෝහලේ අධ්‍යක්‍ෂිකා විශේෂඥ වෛද්‍ය මාලිකා ජයසූරිය මැතිණිය අනුග්‍රාහකත්වය දක්වා තිබිණ. තවද, "නෙත් එෆ්එම්" රේඩියෝ නාලිකාවේ ඉහළ කළමනාකරණ අංශ නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් සිදුකළ මෙම කටයුත්තට එහි නිවේදක/නිවේදිකාවන්ගේ දරුවන්ද සම්බන්ධ කර ගැනිණ. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# 54 වන පාබල සේනාංකයේ රණවිරු සැමරුම





30 වසරක යුද්ධය තුළ මන්නාරම් ප්‍රදේශයේ සේවය කරමින් සිටියදී මියගිය රණවිරුවන් සිහිකරමින් පැවැත්වූ රණවිරු සැමරුමක් ඉකුත් මැයි 18 වන දින 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් එම සේනාංක රණවිරු ස්මාරකය අභියසදී පැවැත්විණ. මීට සමගාමීව රණවිරුවන් සිහිකොට බෝධිපූජා පිංකමක් හා ආශිර්වාද පූජාවක්ද පවත්වන ලද අතර, මෙම අවස්ථාව සඳහා එම සේනාංකයේ නිලධාරීන්, සෙසුනිලයෝ රැසක් සහභාගී වූහ.

# 22 වන පාබල සේනාංකාධිපති බලසේනා සංචාරයක





22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ඉකුත් ජූනි 08, 10, 11, 13 සහ 14 යන දිනයන්වලදී එම සේනාංකය යටතේ ඇති 221, 222 සහ 223 වන පාබල බලසේනාවල සහ බළඇණිවල සිය ප්‍රථම නිල සංචාරය සිදුකරන ලදී. එහිදී, සේනාංකාධිපති වෙත ඒ ඒ මූලස්ථානයන්හිදී යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව උණුසුම් පිළිගැනීමක් හිමිවිය. සිය සංචාරයේදී එහි හටපිරිස් ඇමතූ සේනාංකාධිපති බළඇණි පුහුණු පාසල තාවුල්වැවෙහි සංචාරයක නිරත වෙමින් දැනට එහි පුහුණුවීම්වල නිරතව සිටින 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ රෙජිමේන්තුවේ හටපිරිස් අමතමින් "ජීවිතය"යන මාතෘකාව යටතේ දේශනයක් ද පවත්වන ලදී.

# වැඩිහිටි නිවාසය සඳහා මදුරුනාශක උපකරණ පරිත්‍යාගයක්



*"Little Sister of the Poor"* වැඩිහිටි නිවාසයට කෘමිනාශක යන්ත්‍ර පරිත්‍යාග කිරීමක් ඉකුත් ජූනි 04 වන දින 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ සිදුකෙරිණ. එහිදී රුපියල් 76000.00 ක මූල්‍ය වටිනාකමකින් යුත් යන්ත්‍ර 04 ක් පරිත්‍යාග කරන ලද අතර, ඒ සඳහා එක්සත් රාජධානියේ නිශාන්තන් යන අය සහ මඩකලපුවේ *"Singing Fish Lions Club"* දායකත්වය දක්වන ලදී. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා නිලධාරීන්, සහකාර පොලිස් අධිකාරී - මඩකලපුව, පොලිස් ස්ථානාධිපති - මඩකලපුව සහ *"Singing Fish Lions Club"* හි සාමාජිකයෝ රැසක්ද සහභාගී වූහ.

# තැන තැන පොසොන් අසිරිය



පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන අත්තිඩියේ පිහිටි රණවිරු සම්පත් කේන්ද්‍රයේදී පොසොන් දිනට සමගාමීව බෝධිපූජා පිංකමක් පවත්වන ලදී. ඒ සඳහා රණවිරු සම්පත් කේන්ද්‍රයේ සේනාවිධායක ඇතුළු කාර්ය මණ්ඩලය සහ පාඨමාලා හදාරනු ලබන සෙසුනිලයෝ රැසක් සහභාගී වූහ.



4 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ භටපිරිස් මැදිහත්ව රංගිරි දඹුලු රජමහා විහාර පරිශ්‍රය මූලික කරගනිමින් විශේෂ පොසොන් කලාපයක් ප්‍රදර්ශනය කරන ලදී. තවද, එම පූජා භූමිය ශුද්ධ පවිත්‍ර කිරීමේ වැඩසටහනක් සහ ඒ අවට රුක්රෝපණ වැඩසටහනක්ද ක්‍රියාත්මක කරනු ලැබිය.



12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ අදහසකට අනුව පොසොන් පොහොය නිමිති කරගෙන එම පාබල සේනාංකය ඉදිරිපිටදී දිවා සහ රාත්‍රී කහබත් දන්සැලක් පවත්වනු ලැබිය.



16 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් වව්නියාව, කනගරායන්කුලම් ප්‍රදේශයේදී සිවිල් ජනතාව සඳහා පොසොන් බත් දන්සැලක් පවත්වන ලදී. තවද 56 වන පාබල සේනාංක භටපිරිස් හි දෑතින් නිමවූ මහින්දාගමනය නිරූපණය වන මිහින්තලා අනුරුව සහ පහන්කූඩු ප්‍රදර්ශනයක් ද එහිදී පැවැත්විණ.



පොසොන් පොහොයට සමගාමීව 23 වන විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් එම ඒකක බලප්‍රදේශයේ සිවිල් ජනතාව වෙනුවෙන් ඉකුත් ජුනි 03 වන දින සිසිල් පැන් දන්සැලක් පවත්වන ලදී.





68 වන පාබල සේනාංකයේ හටපිරිස් පොසොන් උත්සවයට සමගාමීව පහන්කූඩු ප්‍රදර්ශනයක්, බත් සහ අයිස්ක්‍රීම් දන්සැලක් ඉකුත් ජූනි 03 වන දින පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණයේදී පැවැත්වූහ.

593 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අදහසකට අනුව එම හටපිරිස් එකතුව එළැඹි පොසොන් පොහොයට සමගාමීව කෙහෙඹගස් හංදිය ක්‍රීඩාංගණය අසලදී සිසිල්පැන් දන්සැලක් පැවැත්වූහ.





පොසොන් පුර පසලොස්වක පොහොය දිනය නිමිත්තෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපතිගේ උපදෙස් පරිදි ආගමික වැඩසටහන් රැසක් පැවැත්විණ. එහිදී, දියතලාව වෙළඳ සංගමය සහ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) සමග එක්ව මහා බත් දන්සැලක් ද දියතලාව නගරයේදී පැවැත්විණ. තවද, හල්දුම්මුල්ල මහජන ක්‍රීඩාංගණයේදී සහ කුඹල්වෙල මහමෙව්නා භාවනා මධ්‍යස්ථානයේදී පහන්කූඩු ප්‍රදර්ශනයක්ද පවත්වන ලදී.



231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ මගපෙන්වීම යටතේ 4 වන ගැමුණු හේවා බලඇණියේ හටපිරිස් විසින් උන්නච්චි නගරයේදී පොසොන් දන්සලක් පවත්වන ලදී. ප්‍රදේශයේ සිවිල් වැසියන් 2500 කට ආසන්න පිරිසක් එම දන්සැල භුක්ති විඳීම සඳහා සහභාගීවීම විශේෂත්වයකි.



11 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් විසින් කුරුකල්මඩු නගරයේදී පොසොන් දන්සැලක් පවත්වන ලදී. 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ මගපෙන්වීම යටතේ මෙම කටයුත්ත සිදුකෙරිණ.

## තැන තැන
# පොසොන් අසිරිය





24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මගපෙන්වීම මත පසුගිය පොසොන් පොහොය දිනයට සමගාමීව 241 වන පාබල බලසේනාවේ හටපිරිස්, අක්කරපත්තුව වෙළඳ සංගමය සහ ඒ මොල් හිමියන්ගේ අනුග්‍රහකත්වයෙන් ප්‍රථම වරට සංවිධානය කරන ලද බත් දන්සැලක් 241 වන පාබල බලසේනා මූලස්ථානය ඉදිරිපිටදී 2023 ජූනි 03 වන දින පවත්වනු ලැබූහ.

ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපතිගේ මගපෙන්වීම මත එම ආරක්ෂක සේනා මූලස්ථානයේ හටපිරිස් විසින් වැලිකන්ද නගරයේදී "කොස් සහ මඤ්ඤොක්කා දන්සැලක්" පොසොන් පොහෝ දින උදෑසන පවත්වන ලදී.

තවද එදින රාත්‍රියේ ආරක්ෂක සේනා මූලස්ථාන (නැගෙනහිර) ප්‍රධාන මාණ්ඩලික ශාඛාව, පරිපාලන ශාඛාව, ලඝු-සටහන් ශාඛාව සහ වැලිකන්ද ගැරිසන් ඉංජිනේරුවන් විසින් නිර්මාණය කරන ලද අලංකාර පොසොන් පහන් කූඩු රැසක්ද ප්‍රදර්ශනය කෙරිණ.



55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මගපෙන්වීම යටතේ පොසොන් පොහොය දිනයට සමගාමීව කඩෙයිකාඩු සහ ඒ අවට ප්‍රදේශයේ සිවිල් වැසියන් 1500 කට අධික පිරිසකට බනිස් සමග තේපැන් දන්සැලක් ඉකුත් ජූනි 03 වන දින පැවැත්විණ. තවද 12(සේව) විජයබාහු පාබල රෙජිමේන්තුවේ හටපිරිස් විසින් අයියකච්චි හරහා ඒ 09 මාර්ගයේ ගමන්ගත් සිවිල් වැසියන් සඳහා සිසිල් බීම සහ බිස්කට් දන්සැලක් ලබාදෙන ලදී.





54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මගපෙන්වීම යටතේ 541, 542 සහ 543 වන පාබල බලසේනාවන් සහ ඒ යටතේ ඇති ඒකකයන්හි හටපිරිස් හි දායකත්වයෙන් දර්ශනීය පොසොන් කලාපයක් මන්නාරම් ප්‍රදේශයේ සංවිධානය කරන ලදී. මෙහිදී, ප්‍රදේශයේ දමිළ පාසල්හි දරු දැරියන් සහ 54 වන පාබල සේනාංකයේ සෙබළ සෙබළියන්ගේ මියුරු සත්සර මැද්දේ පොසොන් භක්ති ගීත ප්‍රසංගයක් ද පැවති අතර, ඊට විශාල ජනකායක් එක්වූහ.







පොසොන් පොහොය දිනයට සමගාමීව ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) විසින් ධර්ම දේශනාවක්, රොටී, මඤ්ඤොක්කා, කොත්තමල්ලි සහ බෙලිමල් ඇතුළත් දන්සැලක් පවත්වන ලදී.

තවද, 3 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ මූලිකත්වයෙන් රොටී සහ කොත්තමල්ලි දන්සැලක් පැවැත්වූ අතර, කඳවුර ඉදිරිපිට මිහින්තලයක අනුරුවක්ද ප්‍රදර්ශනය කරන ලදී. තවද, 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සහ 3 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් විසින් භක්තිගීත ප්‍රදර්ශනයක්ද පවත්වන ලදී. එසේම, 521 වන පාබල බලසේනාවේ සහ 10 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සංවිධානය කරන ලද බිස්කට් සහ කොත්තමල්ලි දන්සැලක්ද එම කඳවුරු ඉදිරිපිටදී පැවැත්විණ.

නාවට්කුලි සමාධි සුමන විහාරයේ විහාරාධිපති, පූජ්‍ය හංවැල්ලේ රතනසිරි හිමියන්ගේ ඉල්ලීමකට අනුව 523 වන පාබල බලසේනාවේ සහ ඒ යටතේ ස්ථාපිත 11 වන කාරක ඉංජිනේරු බලකායේ සහ 7 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ භටපිරිස් එම විහාරස්ථාන පරිශ්‍රයේ දී දන්සැලක් පැවැත්වූහ.



ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) භටපිරිස් විසින් යුද්ධ හමුදා ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේ සීල සමාධි වැඩසටහන් රැසක් සිදුකරනු ලැබූ අතර, හෝමාගම - පිටිපන පොසොන් කලාපයක් සහ මහින්ද රාජපක්‍ෂ විද්‍යාලීය ක්‍රීඩාංගණයේ බත් දන්සැලක්ද පවත්වන ලදී.

තවද, මෙම ආරක්‍ෂක සේනා මූලස්ථානය යටතේ ඇති පාබල සේනාංක, පාබල බලසේනා සහ ඒකකයන්හි දායකත්වයෙන් ආගමික වැඩසටහන් රැසක් පවත්වනු ලැබීය. එහි විශේෂ අවස්ථා පහත දැක්වේ.











# අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම පිළිබඳ වැඩමුළුවක්

යුද්ධ හමුදාවේ රාජකාරී කරන ගණක නිලධාරීන් සහ විගණන ලිපිකරුවන් වෙනුවෙන් සංවිධානය කරනු ලැබූ අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ වැඩමුළුවක් ඉකුත් මැයි 23 හා 24 යන දෙදින තුළ යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඒස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනයේ පූර්ණ අධීක්ෂණය යටතේ මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජෙනරාල් ඇතුළු විද්වත් දේශකයෝ රැසක් මෙම වැඩමුළුව මෙහෙයවනු ලැබූහ.

# විගණන නිරීක්ෂණ අවම කරගැනීම පිළිබඳ වැඩමුළුවක්





යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණගේ පූර්ණ අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂක අභ්‍යන්තර විගණනයේ මෙහෙයවීමෙන් සංවිධානය කෙරුණු විගණන නිරීක්ෂණ අවම කරගැනීම අරමුණු කරගත් එක්දින වැඩමුළුවක් ඉකුත් ජූනි 14 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. ජාතික විගණන කාර්යාලයේ නියෝජ්‍ය විගණකාධිපති විසින් ඊට සම්පත් දායකත්වය ලබාදෙන ලදී.

# පාරිභෝගික අයිතිවාසිකම්, යුතුකම් සහ නීතිරීති පිළිබඳ දේශනයක්



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) දේශන ශාලාවේදී ඉකුත් මැයි 30 වන දින පාරිභෝගික අයිතිවාසිකම්, යුතුකම්, පිළිබඳව සහ පාරිභෝගික නීතිරීති පිළිබඳව දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්විණ. බදුල්ල පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ එම්එච්එම් රිෆාජ් විමර්ශණ නිලධාරී විසින් මෙම දේශනය පවත්වන ලද අතර, මේ සඳහා එම මූලයේ මෙන්ම ඒ යටතේ පාලනය වන පාබල බලසේනා, ඒකකයන්හි රාජකාරී කරනු ලබන නිලධාරීන්, සෙසුනිලයෝ රැසක් සහභාගී වූහ.

# "ප්‍රීතිමත් ජීවිතයක්" දේශන මාලාව





ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ අදහසකට අනුව කාන්තා සෙබළියන්ගේ රාජකාරී සහ පුද්ගලික ජීවිතයට වැදගත්වන යහපත් ආකල්ප, ගුණධර්ම, කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් යුතුව සාමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක වැඩසටහනක් හා දේශන මාලාවක් පසුගියදා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. ලුතිනන් කර්නල් ඩබ්ලිව්ඩීසීඩීබී දිසානායක විසින් පවත්වන ලද මෙම දේශන මාලාව සඳහා යුද්ධ හමුදා කාන්තා බලකායේ නිලධාරිනියන් හා සෙබළියෝ රැසක් සහභාගී වූහ.

# පානීය ජල අවශ්‍යතා සපුරාලමින්



කොන්ගොල්ලෑව ප්‍රාථමික විද්‍යාලේ ඉදිකරන ලද ජල පිරිපහදු යන්ත්‍රයක් (RO Plant) සහ ඒ සඳහා වූ ගොඩනැගිල්ලක් ඉකුත් ජූනි 11 වන දින විවෘත කෙරිණ. මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වකුගඩු රෝග හේතුවෙන් වැඩි වශයෙන් පීඩා විඳින කොන්ගොල්ලෑව ළමුන් සහ ගම්වාසීන්ගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීම මෙහි අරමුණයි.

මේ සඳහා පිටකොටුව සමන් ට්‍රේඩර්ස් ආයතනයේ අධිපති සමන් ගුණතිලක මහතා සහ එම පවුලේ අයවලුන්ගේ මූල්‍ය අනුග්‍රාහකත්වය ලැබිණ. මෙම ව්‍යාපෘතිය හරහා කොන්ගොල්ලෑව ප්‍රාථමික විද්‍යාලේ පාසල් ළමුන්ගේ සහ ප්‍රදේශවාසීන් 2500ක ගේ පමණ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමට හැකියාව ලැබී ඇත. තවද, මෙම වැඩසටහන සඳහා 211 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්සීපී විජයරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් එම්සී මලවිආරච්චි මහත්මිය, 211 වන පාබල බලසේනාවේ සහ 2(සේවා) විජයබා පාබල රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# සංචාරයක මතක සටහන්





61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති හා ගැමුණු හේවා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඊඒඩීපී එදිරිසිංහ පීඑස්සී පසුගිය ජූනි 06 වන දින මාතර ලන්දේසි කොටුව තුළ පිහිටා ඇති 3(සේවා) ගැමුණු හේවා බළඇණියේ නිරීක්ෂණ චාරිකාවකට එක්විය. එහිදී, රෙජිමේන්තු අධිපති වෙත ඒකක හටපිරිස් වෙතින් හිමිවූයේ ගෞරවනීය පිළිගැනීමකි. සිය සංචාරය තුළ කොනොනිවරුන්ගේ හා සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරන ලද කොනොනි සමාජ ශාලාවේ ඉහළ මහල විවෘත කිරීමටද එක්වූ රෙජිමේන්තු අධිපති එම ඒකක හටපිරිස් ඇමතීමටද කටයුතු කළේය.

# 35 වසරක අභිමානය සමරමින්





සංඥා බලසේනා මූලස්ථානයේ 35 වන සංවත්සරය ඉකුත් ජූනි 01 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් පැවති සංවත්සර සැමරුම් උත්සවය බලසේනාධිපති කර්නල් එච්ඩීජේපී වීරතුංග ගේ ප්‍රධානත්වයෙන් හමුදා සම්ප්‍රදායානුකූලව අභිමානවත් අයුරින් පැවැත්විණ. එහිදී, සියලු නිල තේපැන් සංග්‍රහය, ආගමික වතාවත් මෙන්ම මීගොඩ මහාබෝධි ළමා නිවාසයේ දූ දරුවන් වෙනුවෙන් දිවා ආහාර වේලක් පිරිනැමීම මෙන්ම ඔවුන් වෙත අත්‍යාවශ්‍ය භාණ්ඩ පිරිනැමීම විශේෂ විය.

# කොනොනි නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලා - අංක 49

යුද්ධ හමුදාවේ කොමිෂන් නොලත් නිලධාරීන්ගේ පුද්ගලික හා සාමූහික නායකත්ව දැනුම වර්ධනය කර යුද්ධ හමුදා අණපනත් හා නියෝග තුළින් ඔවුන්ගේ බුද්ධි මට්ටම ඉහළ නංවමින් තම යටත් පිරිස කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා අවශ්‍ය දැනුම වර්ධනය කිරීම අරමුණු කරගෙන සටන් පුහුණු පාසල - අම්පාර වෙතින් පැවැත්වූ කොනොනි නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව - අංක 49 ඉකුත් ජූනි 10 වන දින අවසන් විය.



එම පාඨමාලාව සඳහා යුද්ධ හමුදාවේ සියලු රෙජිමේන්තුවලට අයත් නිත්‍ය සහ ස්වේච්ඡා ඒකක වෙතින් සිසු සිසුවියන් 95 දෙනකු සහභාගී වූ අතර, මෙම පාඨමාලාවේ අවසන් දේශනය එම පුහුණු පාසලේ අණදෙන නිලධාරී කර්නල් එම්කේඒඩී චන්ද්‍රමාල් ආර්එස්පී විසින් සිදුකරන ලදී. එහිදී, අති විශිෂ්ට සාමාර්ථයක් ලබාගනිමින් පාඨමාලාවේ ප්‍රථම ස්ථානය හා දක්ෂතම සිසුවාට හිමි සම්මානය 10 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට අයත් සෙ/163809 ලා/බො ගමගේ ඩීඑම්එස්ඩී විසින් හිමිකරගන්නා ලදී.

# 29 වන සංවත්සරය අභිමානවත්ව සමරමින්



10 වන විජයබාහු පාබල රෙජිමේන්තුව සිය 29 වන සංවත්සරය එම ඒකක අණදෙන නිලධාරී මේජර් කේඑච්සී සමන්ප්‍රිය ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 01 වන දින සමරනු ලැබීය. එහිදී, අණදෙන නිලධාරී වෙත කදවුරු සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාළියක් පිරිනැමීම, සංවත්සර දිනයට සමගාමීව ක්‍රීඩා තරග පැවැත්වීම, ආගමික වතාවත්, සියලු නිල දිවාභෝජනය සංවත්සර වැඩසටහන් අතර කැපීපෙනුනි.

# අත්කම් හා ආහාර නිෂ්පාදන ප්‍රදර්ශනය - 2023





කාර්මික සංවර්ධන මණ්ඩලයේ පූර්ණ සංවිධායකත්වයෙන් යුතුව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී ඉකුත් ජූනි 22 වන දින සිට 25 වන දින දක්වා අත්කම් හා ආහාර නිෂ්පාදන ප්‍රදර්ශනයක් පැවැත්විණ. ඒ සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී වීඑස්වී යූඑස්පී ගේ මගපෙන්වීම යටතේ එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මියගේ පූර්ණ අධීක්ෂණයෙන් යුතුව රණවිරු අත්කම් හා ආහාර ප්‍රදර්ශන කුටියක්ද ඇතුළත් විය. එය එහි පැමිණි බොහෝ දෙනකුගේ ආකර්ෂණය දිනාගත් ප්‍රදර්ශන කුටියක් බවට පත්විය.

## අභිනවයෙන් ඉදිකළ ගොඩනැගිල්ල සිසු අයිතියට





11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා ශ්‍රම දායකත්වය මත අභිනවයෙන් ඉදිකරන ලද හඟුරන්කෙත දිඹුල්කුඹුර විද්‍යාලයේ දෙමහල් ගොඩනැගිල්ල විවෘතකර සිසු අයිතියට පැවරීමේ උත්සවය ඉකුත් ජූනි 04 වන දින පැවැත්විණ. එහිදී, ශ්‍රී සරණංකර විමලධම්මාභිධාන අනුනායක හිමියන්ගේ ධන පරිත්‍යාගයෙන් එම පාසලේ ඉගෙනුම ලබන දූ දරුවන් 157 දෙනකු වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක්ද දියත් කෙරිණ.

## සිවිල් ජනතාව වෙනුවෙන් වෛද්‍ය සායනයක්



562 වන පාබල බලසේනා මූලස්ථානය හා වව්නියාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඒකාබද්ධව සංවිධානය කළ වෛද්‍ය සායනයක් ඉකුත් ජූනි 24 වන දින ඊච්චන්කුලම් ග්‍රාමසේවා වසමට අයත් තච්චිකුලම් මහා විද්‍යාලයේදී පැවැත්විණ. මෙම මහඟු කටයුත්ත 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ජීපීඑම් කාරියවසම් ආර්එස්පී පීඑස්සී අයිජී ගේ මගපෙන්වීම යටතේ 562 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ජේඑම්ජී ජයසේකර ආර්එස්පී යූඑස්පී ගේ පූර්ණ අධීක්ෂණය මත සිදුකෙරිණ.

මෙම වෛද්‍ය සායනය මගින් බෝනොවන රෝග සම්බන්ධව පරීක්ෂාවන් සිදුකරන ලද අතර, ජනතාවට යහපත් සෞඛ්‍ය තත්වය පවත්වාගැනීම සඳහා වෛද්‍ය උපදෙස් ලබාදීමද සිදුකෙරිණ. එම අවස්ථාව සඳහා වව්නියාව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය එම් මහේන්ද්‍රන් මහතා, වව්නියාව මහ රෝහලේ අධ්‍යක්ෂක වෛද්‍ය නිලක්ෂන් මහතා සහ තවත් වෛද්‍යවරු රැසක් ඇතුළු 25 කට වැඩි වෛද්‍ය කාර්යය මණ්ඩලයක් දායකත්වය ලබාදුන්හ.









# විරු කැකුළු දරුවන්ගේ කුසලතා ඇගයේ

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් රණවිරු සුභසාධනය අරමුණු කොටගෙන දිවයිනේ විවිධ ප්‍රදේශවල ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් පෙරපාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබයි. එමගින් යුද්ධ හමුදා නොවන අයවලුන්ගේ දරුවන් හටද අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසාදී ඇත. ඒ අතුරින් පල්ලේකැලේ, පනාගොඩ, දියතලාව සහ ගාල්ල විරු කැකුළු පෙර පාසල්හි ඉගෙනුම ලබන දරු දැරියන්ගේ එළිමහන් ක්‍රියාකාරකම් ඔප්නැංවීමේ අරමුණින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකි ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු වාර්ෂික ක්‍රීඩා උත්සවයන්හි මතක සටහන් මෙහි දැක්වේ.





ඉකුත් ජූනි 20 වන දින පනාගොඩ විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේ පැවති ක්‍රීඩා උත්සවය



ඉකුත් ජූනි 16 වන දින දියතලාව විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේ පැවති ක්‍රීඩා උත්සවය




ගාල්ල විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී ඉකුත් ජූනි 14 වන දින පැවති ක්‍රීඩා උත්සවය



ඉකුත් ජූනි 23 වන දින පල්ලෙකැලේ විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී පැවති ක්‍රීඩා උත්සවය



පසුගිය ජූනි 26 වන දින ඉපලෝගම විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේ පැවති ක්‍රීඩා උත්සවයේ අවස්ථාවන්



අනුරාධපුර විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී ඉකුත් ජූනි 26 වන දින පැවති ක්‍රීඩා උත්සවය




මැතිංටවුන් විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී ඉකුත් ජූනි 28 වන දින පැවති ක්‍රීඩා උත්සවය



මින්නේරිය විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී ඉකුත් ජූනි 30 වන දින පැවති ක්‍රීඩා උත්සවය











# වර්ෂ පූර්ණය සමරා ආගමික වැඩසටහන් රැසක්

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සිය තනතුරේ වැඩ භාරගෙන වසරක් සම්පූර්ණවීම සහ පොසොන් පොහොය දිනය නිමිත්තෙන් ඉකුත් ජූනි 03 වන දින කෝට්ටේ ශ්‍රී නාග විහාරස්ථානයේදී සාංඝික දානමය පිංකමක් පැවැත්විණ.

එහිදී, වැඩමකර වදාළ එම විහාරස්ථානයේ විහාරාධිපති සුභද්‍රාරාම විද්‍යායතන මහා පිරිවෙනේ නියෝජ්‍ය පරිවේණාධිපති, රාජකීය පණ්ඩිත දර්ශනපති පූජ්‍ය වතුරවිල සිරි සුජාත නායක ස්වාමීන් වහන්සේ විසින් සේවා වනිතා ඒකක සභාපතිනි ඇතුළු පවුලේ සැමට ආශිර්වාද ප්‍රාර්ථනා කරන ලදී. එසේම, රණක්ෂතයට පත් විරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමත්, දැනට සේවයේ යෙදී සිටින සහ විශ්‍රාම ලැබූ රණවිරුවන්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට නිරෝගී සුවය ප්‍රාර්ථනා කිරීමත් සිදුකෙරිණ.

තවද, එම පිංකමෙහි කටයුතු නිමවීමෙන් අනතුරුව 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවට අයත් සෙ/තිදු107780 කෝප්‍රල් ප්‍රනාන්දු ඩබ්ලිව්එච්ඩබ්ලිව් යන කොනොනිගේ අසනීප තත්වයෙන් පසුවන බිරිඳගේ සුවදුක් සොයාබැලීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ඔහුගේ නිවස වෙත ගොස් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළු තෑගි පාර්සල් පිරිනැමීමද සිදුකළාය.

# ලෝක පියවරුන්ගේ දිනය සමරමින්





ඉකුත් ජූනි 18 යෙදුනු ලෝක පියවරුන්ගේ දිනයට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් අංක 55, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල ලිපිනයේ පිහිටා ඇති වැඩිහිටි නිවාසයේ නේවාසිකව සිටින පියවරුන් සඳහා දහවල් දානය ලබාදීමේ පිංකමක් සිදුකරනු ලැබීය.

මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ. දානමය පිංකම අවසානයේ එම නිවාසයේ නේවාසික පහසුකම් ලබන අයවළුන්ගේ මානසික සුවතාවය වැඩිදියුණු කිරීම උදෙසා රංගකලාඅම  කැලිප්සෝ කණ්ඩායම විසින් සංගීත රසාස්වාදය ලබාදීමට ද කටයුතු සිදුකරන ලදී. අනතුරුව, සේවා වනිතා ඒකකයේ දායකත්වයෙන් නේවාසික අයවළුන් සඳහා පිළියෙල කරන ලද අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් පිරිනැමීමද සිදුකෙරිණ.

# යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මාසික සභා රැස්වීම








යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මාසික සභා රැස්වීම ඉකුත් ජූනි 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ එම මාසික සභා රැස්වීම සඳහා සියලු රෙජිමේන්තු නියෝජනය කරමින් සේවා වනිතා ශාඛාවන්හි සභාපතිනියන් හා සාමාජිකාවෝ සහභාගී වූහ.

සභාවාරය අවසන් වීමෙන් අනතුරුව රණවිරු සුභසාධනය උදෙසා පරිත්‍යාග කිහිපයක් පිරිනැමීමේ වැඩසටහනක් ද පැවැත්විණ. එහිදී, මාතෘභූමිය වෙනුවෙන් ප්‍රාණදානය පුදකළ රණවිරුවන් දෙදෙනකුගේ පාසල් දරුවන් 03 දෙනකු හට එක් අයකුට රුපියල් 120,000.00 බැගින් වූ ශිෂ්‍යත්ව 03 ක් පිරිනැමීම සහ ගජබා රෙජිමේන්තු රණවිරුවකු හට අඩක් නිමකර ඇති ඔහුගේ නිවසේ ඉදිරි වැඩකටයුතු සිදුකිරීම සඳහා රුපියල් 450,000.00 ක මුදලක් පිරිනැමීමද මෙහිදී සිදුවිය.

තවද, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයත්, යුද්ධ හමුදා සේවා බලකායත් එක්ව දියත් කරනු ලබන යෝගට් ව්‍යාපෘතියේ ලාභාංශ මුදල් යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය වෙත පිරිනැමීමද එහිදී සිදුකෙරිණ. එසේම, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සුභසාධන කටයුතු වඩාත් ශක්තිමත්ව කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛා සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මිය සහ සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛා සභාපතිනි රජිතා ජයසූරිය මහත්මිය යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත මූල්‍ය පරිත්‍යාගයන් ද සිදුකළහ.

## දූ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ළමා උද්‍යානයක් විවෘත කෙරේ





53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ මගපෙන්වීම යටතේ එම සේනාංක භූමිය ඉදිරිපස දූ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා නිර්මාණය කළ ළමා උද්‍යානයක් සහ වායු රයිෆල් වෙඩි පිටියක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි 30 වන දින විවෘත කෙරිණ. ඊට කිඩ්ස් වර්ල්ඩ් පෙරපාසලේ ඉගෙනුම ලබන දූ දරුවන්, පාලිකාවන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

## සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවෙන් දිවිය දිනුමට අත්වැලක්



6 වන සන්නාහ සන්නද්ධ බලකායට අයත් හදිසි අනතුරක් හේතුවෙන් මියගිය සෙ/105165 රෝසෙ ඉන්දුකුමාර ආර්එම් යන සෙනියාගේ බිරිඳගේ ආර්ථික අපහසුතා මගහරවා ගැනීමට ස්වයං රැකියා ආධාර වශයෙන් රෙදි මහන යන්ත්‍රයක් පරිත්‍යාග කෙරිණ. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වෛද්‍ය හර්ෂණී බෝතොට මහත්මියගේ මූලිකත්වයෙන් ඉකුත් මැයි 22 වන දින එම මාහැඟි කටයුත්ත සිදුවිය.

## පොසොන් පොහොයට සංඥා බලකා සේවා වනිතාවෙන් සත්කාරයක්





පොසොන් පුර පසළොස්වක පොහොය නිමිත්තෙන් ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් විසින් මහනුවර ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රය අසල සව් දන්සැලක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ ශ්‍රී ලංකා සංඥා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩියූ, එම බලකායේ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එම් නාලිනී රත්නායක මහත්මිය, සංඥා බලකායේ නිලධාරීන් සහ සේවා වනිතා සාමාජිකාවෝ රැසක් ඊට සහභාගී වූහ.

# පොසොන් පොහොය නිමිත්තෙන් පාබල හමුදා සේවා වනිතා ශාඛාවෙන් සත්කාරයක්





පොසොන් පුර පසලොස්වක පොහොය නිමිති කොටගෙන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ධනුෂා වීරසූරිය මහත්මියගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිල්වර් බියුගල්ස් අවන්හල අසලදී මඤ්ඤොක්කා දන්සැලක් පැවැත්විණ.

## සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවෙන් හිසට සෙවණක්



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඔමිලා ජයවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් එහි සාමාජිකාවෝ පිරිසක් මුල්ලේරියාව මානසික රෝහලේ වාට්ටු අංක 05 හි නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් විමසා බැලීම සඳහා ඉකුත් ජූනි 17 වන දින සංචාරයක නිරතවූහ. එහිදී, එම රෝගීන් 35 දෙනකු සඳහා එදිනෙදා ප්‍රයෝජනයට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් පිරිනමා උදෑසන තේපැන් සංග්‍රහයක්, දිවා ආහාර වේලක් සහ ඔවුන්ගේ රසාස්වාදය උදෙසා කැලිප්සෝ සංගීත කණ්ඩායමක සංගීත වැඩසටහනක් ද පවත්වන ලදී.

## ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් හිසට සෙවණක්

ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාලිකා එදිරිසිංහ මහත්මියගේ අදහසකට අනුව 1 වන ගැමුණු හේවා බලකායට අයත් සෙ/432979 පාසෙ හේවගේ එච්ජීසී යන සෙබළා හට නව නිවසක් ඉදිකරදෙන ලදී. එම නිවස ඉදිකරදීම සඳහා විජේරත්න බණ්ඩාර රත්මුදුගල මහතා සහ ඔහුගේ දූවා දරුවන් විසින් මූල්‍ය දායකත්වය දැක්වූ අතර, 1 ගැමුණු හේවා බලඇණියේ හටපිරිස් හි ශ්‍රම දායකත්වයෙන් මෙම නිවස ඉදිවිය. ඉකුත් ජූනි 09 වන දින ගැමුණු හේවා බලකා රෙජිමේන්තු අධිපති සහ එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ සුරතින් එම නව නිවස අදාළ සෙබළා වෙත ප්‍රදානය කරනු ලැබීය.






## යාන්ත්‍රික පාබල රෙජිමේන්තු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය රාජකාරී අරඹයි

යාන්ත්‍රික පාබල රෙජිමේන්තු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ලෙස සෙනාලි දුල්කා හේරත් මහත්මිය ඉකුත් ජූනි 10 වන දිනට යෙදුණු සුබ මොහොතින් රාජකාරී ඇරඹුවාය.

# අකුරු කරන දරුවන්ට ඉංජිනේරු සේවා බලකා සේවා වනිතාවෙන් සවියක්

ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ උපදෙස් මත 12(සේවා) ඉංජිනේරු සේවා බලකාය යටතේ සේවයේ නියුතු නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් අතුරින් දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ ඉගෙනුම ලබන දූ දරුවන් හට පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් එම ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් 12(සේවා) ඉංජිනේරු සේවා බලකා පරිශ්‍රයේදී පසුගියදා පැවැත්විණ.





## සේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් ගැබිනි මව්වරුන් හට පරිත්‍යාගයක්





සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මියගේ අදහසකට අනුව එම බලකායේ සේවයේ නියුතු රණවිරුවන්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ ගර්භණී බිරින්දෑවරුන් සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් සහ මෙහෙණින් වහන්සේලා 07 නමක් සඳහා සාංඝික දානය පිරිනැමීමේ වැඩසටහනක් ඉකුත් මැයි 21 වන දින එම බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එහිදී, ගර්භණී මව්වරුන් සඳහා පෝෂණ ගුණයෙන් අනූන දිවා ආහාර වේලක් ද ලබාදීමට කටයුතු කෙරිණ. මෙම අවස්ථාවට සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ඇතුළු සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

## වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි පරිත්‍යාගයක්





වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ අනුග්‍රහයෙන් එම බලකායේ සාමාජිකයින්ගේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරනු ලබන දූ දරුවන් 05 දෙනකු හට වාර්ෂිකව රුපියල් 50,000.00 බැගින් වූ ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් වෛද්‍ය බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් පීඑස්සී ප්‍රනාන්දු යූඑස්පී සහ එහි සේවා වනිතා ශාඛාවේ සභාපතිනි විශේෂඥ වෛද්‍ය නිල්මිණි ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 12 වන දින නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රයේදී පැවැත්විණ.

මෙහිදී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ උපදෙස් පරිදි වෛද්‍ය බලකායට අයත් සෙබළ සෙබළියන්ගේ සහ සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ ආර්ථික අපහසුතා සහිත දූ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක්ද සිදුකෙරිණ. මෙම අවස්ථාවට වෛද්‍ය බලකා සේවා වනිතා සාමාජිකාවන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවෙන් රණාභිතයට පත් විරුවන්ට ත්‍යාග





ක්‍රියාන්විතයේදී ආබාධිත තත්වයට පත් රණවිරුවන්ගේ සුවදුක් සොයාබලා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුවතාවය වෙනුවෙන් ත්‍යාග ලබාදීමේ වැඩසටහනක් යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි 27 වන දින රණවිරු සෙවණ - රාගම පුනරුත්ථාපන මධ්‍යස්ථානයේදී පැවැත්විණ.

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවෙන් වැඩසටහන් රැසක්





ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ අදහසකට අනුව 5 විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය සහ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සන්නද්ධ බළඇණිය එක්ව සාලියපුර ප්‍රදේශයේ සිවිල් ජනතාව, යුද්ධ හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ බිරින්දෑවරුන් වෙනුවෙන් සංවිධානය කළ සුභසාධන වැඩසටහන් මාලාවක් පසුගිය මැයි 27 හා 28 දෙදින තුළ පැවැත්විණ.

ඒ අනුව ඉකුත් මැයි 27 වන දින රුවන්වැලි මහ සෑ රදුන් පරිශ්‍රයේදී අෂ්ඨපරිෂ්කාරක පූජාවක් පවත්වා අටමස්ථානය වැඳපුදා ගැනීමට පැමිණි බැතිමතුන් වෙනුවෙන් මත්පොක්කා දන්සැලක් පැවැත්විණ. තවද, ඉකුත් මැයි 28 වන දින "දිරියට අරුණැල්ලක්" යන තේමාව යටතේ කෘෂිකර්ම නිලධාරී ඩබ්ලිව්ජී අමරජීව මහතා විසින් රණවිරුවන්ගේ ආර්ථික තත්වය වර්ධනය කරගැනීම සහ ක්‍රමවත්ව කෘෂි භෝග වගාකිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 5 විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා කඳවුරේදී පවත්වන ලදී. එහිදී, ඊට සහභාගී වූ රණවිරු පවුල් 30 ක් වෙත ඒ ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරීමට දිරිගැන්වීමක් වශයෙන් රුපියල් 20,000.00 බැගින් වූ මුදල් ප්‍රේෂණපත් සහ එළවළු, පළතුරු බීජ ප්‍රදානය කිරීමටද කටයුතු කෙරිණ.

රටේ ඒකීයභාවය වෙනුවෙන් දිවිහිමියෙන් කැපවී ක්‍රියාකළ දැනට අනුරාධපුරය අභිමංසල සුවසහන මධ්‍යස්ථානයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසූ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා සභාපතිනිය විසින් එහිදී එම මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍යතාවයක්ව පැවති තණකොළ කපන යන්ත්‍ර 02 ක් ද පරිත්‍යාග කරන ලදී.




# පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය රාජකාරී අරඹයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ලෙස ප්‍රියන්තිකා ද සොයිසා මහත්මිය ඉකුත් ජූනි 01 වන දියට යෙදුණු සුබ මොහොතින් රාජකාරී ඇරඹුවාය.




# නන්දිකඩාල්

# සටනට පණ දුන් අභීත විරුවෙක්

**සෙ/ 197405 ලාන්ස් කෝප්‍රල් රත්නායක**
**ආර්එම්ඩීඑම් පිඩබිලිවච**
**ශ්‍රී ලංකා පාබල හමුදාව**

වර්ෂ 1990 ක්වූ සීතල දුරුතු මස 29 වන දින පිණිකැට වැටෙන උදෑසන, හිරු කුමරුන් වැලිමඩ කඳු වළල්ලෙන් වලාකුළු මෑත්කරන ලද්දේ රත්නායක මුදියන්සේලාගේ පුංචි බංඩා හා දිසානායක මුදියන්සේලාගේ යසවතී පින්බර දෙමාපියන් වෙත පස්වන වතාවටත් සුබ පිණිවුඩයක් රැගෙනයි. සිංහලයේ ඓතිහාසික වංශ කතාවේ විරුවන් රැසක් බිහිකළ ඌව වෙල්ලස්ස බදුලු දිස්ත්‍රික්කයේ ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්වභාව සෞන්දර්යයෙන් අනූන යාලගමුව ග්‍රාමය නිජබිම්කොට සපැමිණි දීප්තිමත් දෑසකින් යුතු කුඩා පුතණුවන් යසවතී මැණියන්ට මහාර්ඝ සතුටක් ගෙනදී තිබිණ. දිදුලන දෑසත් එඩිතර සංඛ නාදයත් උරුම කොට පැමිණි කුඩා පුතු දිල්ෂාන් මධුසංඛ යන නම් ලබා යාලගමුවේ රත්නායක පරපුර ඉදිරියට ගොනයාමට ලද මහාර්ඝ වස්තුවක් ලෙස පුංචි බංඩා පියාණන්ට දැනුණු බවට ඔහුගේ මතකය ආවර්ජනය කරයි.

1995 වසරේදී සීතල දුරුතු මහේ උදෑසන පිනිකැට අතුරින් කුඩා මධුසංඛ යාලගමුව මහා විද්‍යාලය වෙත අකුරු කරවීමට පියමන් කළේය. යාලගමුව මහා විද්‍යාලයේ කෙළිදෙළෙන් ගෙවුනු පස් වසරක පාසල් කාලය නොදැනීම ගෙවීගොස් හයවන වසරේ වැඩිදුර අධ්‍යාපනය ලබාගැනීම සඳහා ඔහු බණ්ඩාරවෙල මස්පන්න බණ්ඩාරනායක පර්ෂද විද්‍යාලය වෙත ඇතුළත් වුණි. බණ්ඩාරනායක විද්‍යාලය මධුසංඛගේ ක්‍රීඩා කෞශල්‍යය

වර්ධනය කරවීමට තෝතැන්නක් වුණි. කේඑම් සෝමාවතී පංතිභාර ගුරු මැණියන්ගේ මතකයට අනුව මධුසංඛ අත්පන්දු, දුර දිවීම, හෙල්ල හා කවපෙත්ත විසිකිරීමේ ඉසව් සඳහා විශේෂ දක්ෂතා දක්වා ඇති බව විදුහලෙහි ප්‍රචලිත කරුණකි. ඔහුගේ මනා හික්මීමේ තෝතැන්න බවට පත්වූ යාලගමුව විහාරස්ථ දහම් පාසලට නැතුවම බැරි ශිෂ්‍යන්ගෙන් එක් අයකු වූයේ මධුසංඛයි. ඔහුගේ දායකත්වය නොලැබුණු පිංකමක් එවකට ගම් පියසේ නොවිණි. ක්‍රීඩාවෙන් ලද පන්නරයත්, දහම් අධ්‍යාපනයෙන් ලද හික්මීමත්, තරුණ ජවයත් තුළින් ඔහුට නොදිනිය හැකි ජයටැඹක් නොවීය.

ක්‍රියාකාරකම්වලට පමණක් සීමා නොවූ මධුසංඛ ස්වකීය පංතියේ දහම් දැනුමේ අග්‍රඵල නෙලාගනිමින් මුහුණදුන් දහම් පාසල් විභාගයන්හිදී විශිෂ්ට සාමාර්ථයන් ලබාගෙන ඇති බව ඔහු ලබා ඇති සහතික පත්‍ර සාක්ෂි දරයි.

මෙම තරුණයාට නිවැරදි මාවත ඔස්සේ පිය මනින්නට මංපෙත් පාදාදුන් යාලගමුව විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය පුණ්‍යරතන නායක ස්වාමීන් වහන්සේගේ මතකයෙහි මොහු පිළිබඳ සටහන්ව ඇති බව වදාරන්නට යෙදුණි.

යොවුන ස්වකීය සමාජ වගකීම මැනවින් වටහාගත් ඔහු තමා සමඟ වැලිකෙළියේ පටන් ඇසුරු කළ ගමේ අන් තරුණයන් හා උරෙන් උර ගැටී අත්වැල් බැඳගැනීමෙන් ගමේ අභිවෘද්ධිය සඳහා යොවුන සමාජවල විවිධ නිලතල දරමින් නායකත්වයේ වගකීම කරටගෙන තම යොවුන ජවය නිසි පරිදි සමාජ සත්කාරයක් ලෙස මුදාහැරීම ආරම්භකොට තිබිණි. සමාජයට වැඩදායී පුද්ගලයකුව, ගමට හිතැති තරුණයකුව, යහළුවන්ට සොඳුරු මිතුරකුව, යාලගමුව ග්‍රාමයේ ඔහු ගතකළ තාරුණ්‍යය මොහුගේ මිතුරන් සිහිපත් කරනුයේ මහත් සොම්නසිනි.

මෙම එඩිතර තරුණයා ශ්‍රී ලංකාද්වීපයේ භෞමික අඛණ්ඩතාවය, ස්වෛරීභාවය ආරක්ෂා කිරීම තම දෙමව්පියන් ආරක්ෂා කිරීම හා සමාන වගකීමක් සේ සලකා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳීමට අධිෂ්ඨානකර තම දෙමව්පියන්ගේද ආශිර්වාදය ලබාගත්තේය. පුංචි පියාණන් සිත යටින් තම පුතණුවන්ගේ තීරණය ගැන මහත් ආඩම්බර වන්නට විය. යසවතී මැණියන්ට තම

**මෙම උදාර කර්තව්‍යය සාර්ථකව නිමාකිරීමත් සමගම තමා වෙත යම් ප්‍රහාරයක් ත්‍රස්තවාදීන්ගෙන් එල්ලවූ බව මධුසංඛ රත්නායකට හැඟී ගියත් තම පණමෙන් රැකි ගිනි අවිය දෑඟිලිවලින් මුදාහැරියේ ඔහු නොවේ. සිංහලද්වීපයේ දුටුගැමුණු යුගයේ පටන් අතීත වීරුවන් තමාට ආමන්ත්‍රණය කරන බව ඔහුට ඇසෙන්නට ඇත. ඔහුට හැඟී ගියේ තමාගේ මව්බිම මුදාගැනීමේ කාර්යය මස්තකප්‍රාප්ත වූ බවය. ඒ සමගම දිල්ෂාන් මධුසංක රත්නායක රණවිරුවාගේ ඌව වෙල්ලස්ස යාලගමුව ගම්පියසෙන් ජීවයකොට උරාගත් ප්‍රාණ වායුව දහනව වසරකට පසු නන්දිකඩාල් කළපුව අසන්නයේ මුහුදු සුළඟට මුසුවිය.**

පුතණුවන් මෙලොවට පැමිණි ඒ අසිරිමත් මොහොත යළි මතකයට නැගෙන්නට විය. තම දේශයට සතුරුව නැගී සිටින රුදුරු බෙදුම්වාදය මුලිනුපුටා දැමීමේ ඒකායන අධිෂ්ඨානය පෙරදැරි කරගෙන වර්ෂ 2008 ක්වූ මැයි 21 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලසේනාවට ඇතුළත් වූ දිල්ෂාන් මධුසංඛ රත්නායක එතැන් පටන් රත්නායක ආර්එම්ඩීඑම් වශයෙන් සිය  මූලික යුද පුහුණුව බුස්ස පාබල හමුදා පුහුණු පාසල වෙතින් වර්ෂ 2008 ක්වූ ජුලි 03 වන දින සිට 2008 ක් වූ ඔක්තෝබර් 03 වන දින දක්වා හැදෑරුවේය.

ස්වකීය පාසල් දිවියේ පටන් ක්‍රීඩාශීලි තරුණයකු වූ මධුසංඛ හමුදා පුහුණුව ස්වකීය හැකියාවන් තවත් ඔපමට්ටම් කරගැනීමට අවස්ථාවක් ලබාදුනි. සිය පාඨමාලාවේ කැපී පෙනෙන දක්ෂ සොල්දාදුවකු වූ ඔහු සියලු උපදේශකයින්ගේ පැසසුමට පාත්‍ර වූ අයකු බව දැනට විශ්‍රාම සුවයෙන් පසුවන සෙ/303589 සැරයන් උදයකුමාර බීජීඩී තම මතකයන් අලුත් කරමින් පවසා සිටියේ යුද ශිල්පය හා ශාරීරික යෝග්‍යතා පුහුණුවේදී මධුසංඛ සැමවිටම පෙරමුණ ගෙන සිටි බවය. පුහුණුව නිමාවෙන් පසු ගමේ ඇළේ දොළේ දුවපැන සිටි එඩිතර තරුණයකු විනයගරුක රණකාමී ප්‍රවිෂ්ට හා තේජාන්විත නිල ඇඳුමකින් යුතුව යසවතී මැණියන් හා පුංචි බංඩා පියාණන් ඉදිරියේ පෙනී සිටි අවස්ථාව සිහිනයක් දැයි සිතුණු බව ඔහුගේ දෙමව්පියෝ හැඟුම්බර වී පවසති. වර්ෂ 2008ක් වූ ඔක්තෝබර් මස 22 වන දින පාබල හමුදා රෙජිමේන්තුවේ 6 වන බළඇණියට එක්වීමට වරම් ලද ඔහු බළඇණි    "බී" කණ්ඩායම සමඟ ස්වකීය ගමන ආරම්භ කළේය. සිය කණ්ඩායමට පැමිණීමෙන් පසු ගමන්මගේ ජන්මයෙන් ලද රණකාමී බව හේතුවෙන් ඔහු ඒකක විශේෂ ක්‍රියාන්විත ඛණ්ඩය වෙත යොමුකරවිය.

මෙම වකවානුව වන විට මාවිල්ආරු සොරොව්ව වසා ත්‍රස්තවාදීන් විසින් ජන ජීවිතය අඩාල කරවීමට ගත් අසාර්ථක ප්‍රයත්නය පිටුදකිනුවස් සටන්වැදුණු රණකාමී සොල්දාදුවන් මානුෂීය මෙහෙයුමේ අවසන් අදියර ක්‍රියාත්මක කරමින් පැවතුණි. ඒ සඳහා එක්වීමට ලැබීම මධුසංඛ රණවිරුවා ලද මහා භාග්‍යයක්කොට සැලකූ බව මිතුරන් සමඟ පවසා ඇති බව නොරහසකි. තමා ලද පුහුණුවේ පන්නරයෙන් රට ජාතිය ආරක්ෂා කිරීම සපටකොට ලබාගත් ගිනිඅවිය හසුරවමින් තම සහෝදර සෙබළුන් සමඟ රුදුරු වෙඩි වරුසා මධ්‍යයේ සටනට පිවිසෙන්නේ අතීත රණවිරුවන්ගේ සුරුවිරුකම් යළි කරළියට නංවමිනි. ඉදිරියට එන වෙඩි වරුසාවන්ගෙන් නොසැලුනු ඔහු වරෙක බඩගාමින්ද, ගස්වලට මුවාවෙමින් ලද ඇසිල්ලකින් තම පතරොම් ගැබ පුරවමින්ද, තුවාලවී ඇදවැටෙන තම සගයින් හට යුහුසුලුව පිහිටවෙමින්ද, අසුරු සැණින් තම ගිනි අවියෙන් සතුරාට නිසි පිළිතුරු ලබාදෙමින්ද, යුදබිමෙහි ක්‍රියාකළේ විශිෂ්ඨ රණකාමියකුගේ හැකියාවන් මොනවට පෙන්වමිනි.

එකල මුලතිව් වඩ්ඩුවාකල් නන්දිකඩාල් කලපුවේ දකුණු ඉවුරට සීමාකර තිබූ ආරක්ෂක හමුදා බළඇණි, කළපුව තරණය කර ඉදිරියට යාම සඳහා සර්වතෝවිටම් ප්‍රදේශය දක්වා බලය ව්‍යාප්ත කිරීම සිදුවූ අවදියයි. එම ප්‍රදේශයෙහි උපක්‍රමශීලීව ගමන් කිරීම හමුදාවන්ට ඉතා වැදගත් විය.

එසේ වූයේ බෙදුම්වාදී ත්‍රස්තවාදී නායක වේලුපිල්ලෙයි ප්‍රභාකරන් ඇතුළු ත්‍රස්තවාදී නායකයින් රැසක් මෙම නන්දිකඩාල් කළපු තීරය බාධකයක් කර, ඉදිරියට තබා සැඟව සිටීමයි. මෙම භූමිතීරය බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේ අධි ආරක්ෂක කලාපයක් විය. එම ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා සතුරා සියලු උපක්‍රම භාවිතාකර ඔවුන් සතුව තිබූ බර අවි ස්ථානගතකර තිබුණි. මෙම භාරදූර කටයුත්ත සඳහා ඒකකයේ විශේෂ ක්‍රියාන්විත බණ්ඩය යෙදවූ අතර, දින 04 ක පමණ කාලයක් ආරක්ෂිතව යුද අගල් සකසමින් විවිධ බාධා මධ්‍යයේ හටපිරිස් ඉදිරියට ගමන් කළේය. ත්‍රස්තවාදීන් විසින් ජාත්‍යන්තර මුහුදු කලාපයේ දී පැහැරගෙන රඳවාගෙන තිබූ ෆාරා 3 නෞකාවේ සිට එල්ලකරන ලද බරඅවි ප්‍රහාර හමුවේ ඉහත කළපු භූමිය තරණය කිරීම ඉතා විශාල අභියෝගයක් වූ අතර, වැලිවලින් පිරී තිබූ කළපු දොරටුවෙහි යුද අගල් ඉදිකිරීමේ අභියෝගය ජයගැනීමටත්, ඒකකයේ සෙබළුන් නිදිවරමින් රාත්‍රිය පුරා මහත් වෙහෙසක් දරමින් කටයුතු කරන්නට වූයේ එම අභියෝගය ජයගත් පසු රුදුරු බෙදුම්වාදී ත්‍රස්තවාදීන් අප මව්බිමෙන් මුලුමනින්ම තුරන්කර රටෙහි ඒකීයභාවය හා ස්වෛරීත්වය ගොඩනැගීමේ කොටස් කරුවන්වීමේ අභිලාෂය පෙරදැරිකොට ගෙනය. බෙදුම්වාදී ත්‍රස්තවාදී බාධක, මර උගුල්, බර අවි ප්‍රහාර එල්ලවූද, එකී ප්‍රහාර මැඩපවත්වා ගනිමින් මානුෂීය මෙහෙයුමේ අවසන් අදියරෙහි අපේක්ෂිතය වූ ත්‍රස්තවාදී සංවිධානය විසින් පලිහක් ලෙස රඳවාගෙන සිටි අහිංසක උච්ඩ ජනතාව මුදාගැනීමේ ඒකායන අරමුණින් උපක්‍රමශීලීව මීටර් 300 ක් පමණ වූ කළපු තීරය තරණයකර ත්‍රස්තවාදීන් විනාශකර ඔවුන් සතුව තිබූ ශක්තිමත් ආරක්ෂක වළල්ල අත්පත්කර ගැනීමට මධුශංඛ විශාල මෙහෙයක් ඉටුකරනු ලැබීය.

වර්ෂ 2009 ක් වූ මැයි මස 11 වන දින දිනයේ දී වෙනදා මෙන් නොවිණි. ඌව වෙල්ලස්ස හිරු එබී බැලුවේ මඳක් පමාවීදැයි පුංචි බංඩා පියාණන්ට සිතුණි. සාමාන්‍ය සෙබළ දිල්ෂාන් මධුසංක රත්නායක හට හිරු නැගී, මළහිරු බැසීම හෝ තම ගම්පියස සිසාරා ඇති කඳු පියසේ වැටුණු පිනිකැට පිළිබඳ නිනව්වක් නොවිය. තම ගිනි අවියට ඇත සිරකරගත් ඔහු තම සොයුරු හමුදා සෙබළුන් සමඟ බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේ මර උගුල් හා රුදුරු ප්‍රහාර හමුවේ තමා අයිති විශේෂ ක්‍රියාන්විත බණ්ඩයේ පළමු පෙළෙහි ඉදිරියෙන්ම ගමන්ගත් සාමාජිකයින් 04 දෙනා සමඟ නන්දිකඩාල් කළපුව ආසන්නයේ මව්බිම වෙනුවෙන් තම යුතුකම ඉටුකරමින් සිටියේය.

මෙහිදී, ආරක්ෂක හමුදාවන්ගේ ගමන වළක්වා කිරීමට ත්‍රස්තවාදීන් විසින් නොකඩවා වෙඩි ප්‍රහාර එල්ල කරමින් මරාගෙන මැරෙන බෝට්ටුකරුවන්ද යොදවනු ලැබීය. නන්දිකඩාල් කළපුවට දකුණු දෙසින් ඇතුළුවීමේදී, ඉදිරිපෙළ ප්‍රහාරකයකු ලෙස ත්‍රස්ත ආරක්ෂක වළල්ල අත්පත්කර ගැනීමට ඔහු ක්‍රියාකළ අතර, ක්‍රියාන්විතය අඩාල කිරීමට මරාගෙන මැරෙන බෝට්ටු ඉදිරියට පැමිණෙනු දැක එහි අවදානම හොඳින් වටහාගත් ඔහු සිදුවීමට යන විනාශය වළක්වා සිය සහෝදර සෙබළුන්ගේ ජීවිත ආරක්ෂාව සලසාදීම පිණිස මරාගෙන මැරෙන බෝට්ටුවල දැඩි ප්‍රහාර හමුවේ තමාගේ ජීවිතයද අනතුරට ලක්වන බව දැන දැනම තමා ඉදිරියට පැමිණි මාරගෙන මැරෙන බෝට්ටු වෙත ප්‍රහාරයක් එල්ලකොට එය විනාශකර දැම්මේය.

මෙම උදාර කර්තව්‍යය සාර්ථකව නිමාකිරීමත් සමඟම තමා වෙත යම් ප්‍රහාරයක් ත්‍රස්තවාදීන්ගෙන් එල්ලවූ බව මධුසංඛ රත්නායකට හැඟී ගියත් තම පණමෙන් රැකි ගිනි අවිය දෑගිලිවලින් මුදාහැරියේ ඔහු නොවේ. සිංහල ද්වීපයේ දුටුගැමුණු යුගයේ පටන් අතීත විරුවන් තමාට ආමන්ත්‍රණය කරන බව ඔහුට ඇසෙන්නට ඇත. ඔහුට හැඟී ගියේ තමාගේ මව්බිම මුදාගැනීමේ කාර්යය මස්තකප්‍රාප්ත වූ බවය. ඒ සමගම දිල්ෂාන් මධුසංක රත්නායක රණවිරුවාගේ ඌව වෙල්ලස්ස යාලගමුව ගම්පියසෙන් ජීවයකොට උරාගත් ප්‍රාණ වායුව දහනව වසරකට පසු නන්දිකඩාල් කළපුව අසන්නයේ මුහුදු සුළඟට මුසුවිය.

මරාගෙන මැරෙන බෝට්ටු වෙත දරුණු ලෙස ප්‍රහාර එල්ල කරමින්, ත්‍රස්තවාදීන් හට පරාජයක් අත්කර දෙමින් ඔවුන් මවිත කරමින් සටන් වදිමින් සිටි හිරිමල් වයසේ පසුවූ ජාතිකාභිමානයෙන් ඔදවැඩී සිටි දිල්ෂාන්ගේ ප්‍රාණය නිරුද්ධ සිරුර ලක්මාතාව දරා සිටියේ මහත්වූ අභිමානයකිනි.

තම යුග මෙහෙවර කෙටි කාලයකින් නිමකළ මෙම අභීත රණවිරුවා පූර්ණ යුද්ධ හමුදා ගෞරව සහිතව වර්ෂ 2009 ක් වූ මැයි මස 16 වන දින උඩුකුඹුර ගෙදර පවුලේ සුසාන භූමියේ සැම දෙනාගේම සෝසුසුම් මධ්‍යයේ මිහිදන් කරන ලද්දේය.

උතුරු මානුෂීය මෙහෙයුමේදී ශ්‍රී ලංකාද්වීපය එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් මුදවා ගැනීම සඳහා තම ජීවිතය ගැන නොසලකා සිය සහෝදර සෙබළුන්ගේ ජීවිත ආරක්ෂා කරදීම පිණිස තමා ඉදිරියට පැමිණි මරාගෙන මැරෙන බෝට්ටු වෙත ප්‍රහාරයක් එල්ලකොට ඒවා විනාශකර දැමීම හේතුවෙන් එම වීර වික්‍රමය උදෙසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වූද, සන්නද්ධ සේනාවන්හි සේනාධිනායකයා වූද, මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් වර්ෂ 2012 ක් වූ මැයි මස 19 වන දින ගාලු මුවදොර හිදී පැවැත්වූ තුන්වන විජයග්‍රාහී සැමරුම් පෙළපාලියේදී, දිල්ෂාන් මධුසංඛ රත්නායකගේ නාමය වෙනුවෙන් ඔහුගේ පියාණන් වෙත පරම වීර විභූෂණය පිරිනමන ලදී.

තම පුතණුවන් අහිමිවූ දිල්ෂාන් මධුසංඛ රත්නායකගේ මව්පියන් රට වෙනුවෙන් ජීවිතය පූජාකළ තම පුතු පිළිබඳ ඉමහත් ශෝකයෙන් පසුවන බවත් ඔහුගේ වීරත්වය හේතුවෙන් ඔවුන් ආඩම්බරයට පත්වන බවත් පවසා සිටියේය. ඒ බැව් මනාව තහවුරු වනුයේ ලක්මාතාව සුරැකීමේ පරම චේතනාවෙන් තම සොහොයුරාගේ ජීවිත පරිත්‍යාගය අගය කරනුවස් එහි අඩුව පිරවීම සඳහා යුද්ධ හමුදාව වෙත බැඳී දැනට ගැමුණු හේවා බලකායේ සෙ/424713 සාසෙ රත්නායක ආර්එම්ආර්ඩී වශයෙන් රාජකාරියේ නිරතව සිටින රණවිරු දිල්ෂාන් මධුසංඛගේ උපතට මොහොතකට පෙර මෙලොව එළිය දුටු ඔහුගේ නිවුන් සහෝදරයා නිසාය. එය අප අභිමානයෙන් සිහිපත් කළ යුතුය. තවද, මෙම වීර සෙබළාගේ බාල සොහොයුරා පියා සමඟ ගොවිතැන් කටයුතුවල නිරතවෙමින් දෙමව්පියන්ගේ බර කරට ගෙන කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකා මාතාවගෙන් ත්‍රස්තවාදය අවසන් කිරීම උදෙසා තම පුතු නිර්භයව, ජීවිත පරිත්‍යාගයෙන් සටන් කිරීම සැබෑවිව මවක් ලෙස නිහතමානීව ආඩම්බර වන බැව් ඔහුගේ මව පවසා සිටියි.



සටහන -: "උත්තමාචාරය" ග්‍රන්ථය ඇසුරිනි...



කෙටිකතාව

# කෝප්‍රල් සොයිසා

## නිවාඩු ගියේය

ඕ එන් හර්ට්ය දැවැන්ත පාත්තයකු සේ හඬහගාගෙන විත් බිම් පතිත වී නැවතුණේය. තරප්පුව තබනවාත් සමගම ලහි ලහියේ බිමට බට හමුදා සොල්දාදුවෝ තඩි බෑග් කරේ ලාගෙන ගුවන්පථය කෙළවර නවතා ඇති බසය දෙසට බරැඩි තබමින් ඉක්මන් ගමනින් පියවර මැන්නහ. බස් රථයෙන් අතරමැදි තදපුරට පැමිණි කෝප්‍රල් සොයිසා ද බෑගයේ ඔබාගෙන ආ පොඩිවූ කමිසය කඩිමුඩියේම ඇඟලා ගත්තේය. අහසක් අය හා තරඟයට මෙන් ප්‍රධාන මාර්ගයට අවතීර්ණවූ හෙතෙම ගාලු යන බසයක් අල්ලා ගැනීමට සමත්විය. බසය තුළට වැදුනු ඔහු කිරිපාන් ගෙඩියක් සේ පැහැපත් තරුණියක් ළඟින් අහක බලාගෙනම ඉඳගත්තේය. බිම තැබූ බෑගය දෙසත් ඔහුගේ මුහුණ දෙසත් බැලූ කොන්දොස්තරවරයා කියන්නට ආ යමක් ගිලගත්තේය.

පාබල රෙජිමේන්තුවට අයත් කෝප්‍රල් වරයෙක් වන සොයිසා හිත හොඳ නිර්භීත භටයෙක් මෙන්ම ඉක්මන් කේන්තිකාරයෙක් ලෙසද ප්‍රසිද්ධය. මුහමාලේ ඉදිරි ආරක්ෂක වළල්ලේ පැවති උග්‍ර සටන්වලින් පසුව ඔහු දැන් නිවාඩු ලබා ගෙදර යමින් සිටී.

කෝප්‍රල් සොයිසාගේ සිත නවමන් යකාගේ කම්මල වගේය. සති කීපයකට පසු මහත් අමාරුවෙන් මූලස්ථානයට විත් දුරකථනයෙන් බිරිඳට කතා කළ අවස්ථාව ඔහුගේ මතකයේ රැව් දේ. බිරිඳගේ කටහඬ කන් අතර තෙරපීගෙන මොළය විනිවිද යන්නා සේය. "තාමත් අඬන්නේ නැතිව ගෙදර එනකන් හිටපං" යනුවෙන් පවසමින් රිසිවරය දඩස් ගා තැබූ ආකාරය ඔහුගේ හදවත කොනිත්තන්නට විය. "පොඩි පුතාට උණ, කඩේ යන්න විදියක් නැහැ. වහලේ තෙමෙනවා. දුවගේ ඉස්කෝලෙට ගෙන්න බඩු ලැයිස්තුවක් දීලා. මාස තුනකින් ලයිට් බිල ගෙවන්න බැරි වුණා" මේ ගෑණිගේ කන්දොස්කිරියාව. මුන්ට තේරෙන්නේ නැති හැටි. අපි විඳින දුක දන්නේ දෙවියෝ විතරයි. සද්දයක් ඇහුණ හැටියේ බංකරයට දුවන්න ඕනේ. දවස් දෙකකට පාරයි නාන්න වෙන්නේ. ලන්ච්ෂීට් එකේ ඔතලා එන කෑම එක කන්නනම් බාගයක්වත් ගහලා ඉන්න ඕන.

මෝටර් කැබැල්ලක් වැදී හිසෙන් ලේ ගලමින් ආ බඩියා ඔහුට සිහිවිය. බට්පෙතු පැගී මලක් සේ විහිදුණු කකුලෙන් යුතුව ලාන්ස් කෝප්‍රල් දන්තනාරායන බලා සිටි ආකාරය මැවී පෙනිණ. කෝප්‍රල් සොයිසාගේ මුළු සිරුරම සිහින් දැවිල්ලක් සමග දැවී ගියේය. "මාස තුනට වැඩි විවාහක පස් දෙනකුට නිවාඩු යන්න පුලුවන්" ඔසීගේ බැරෑරුම් මුහුණින් ඔහුට මැවී පෙනිණ. තෙත් වූ නෙතින් යුතුව නිවාඩු අවසර පත අතට ගත් මොහොතද මතකයට නැගිණ.

දීර්ඝ ගමන පුරාම ඔහුට නින්ද නොගියේය. ගෙදරන් කඳවුරත් පසුගිය දිනවල සිදුවූ සිදුවීමුත් ඔහුට වරින් වර රූපපෙලක් සේ මැවී පෙනිණ. ගාල්ල බස් නැවතුමෙන් බැස මඳක් ඉදිරියට ගිය ඔහුගේ ගමන එකවරම බලහත්කාර දිලිසෙන විදුලි ආලෝකය මැද දිස් වූ අවන්හලේ නාම පුවරුව ඔහු දෙස බලා හිනැහෙන්නාක් මෙන් විය. කටට කෙළ ඉනුවේය. ඕන එකක් වුනාවේ. දෙකක් දාගෙනම යනවා ඔහුගේ සිත කීවේය. ඔහු දැන් අවන්හලේ කොනේ මේසයක පුටුවකට බර දී සිටි දකුණතේ ඇඟිලි අතර සිගරට්ටුවක් සිරවී තිබේ. දුම්වලා ඔහු වටා එතෙමින් තනියට සිටියි. බාග බෝතලේ අඩිය පෙනෙන්නට ලගය. කන් පාත් වීගෙන එයි.

බිරිඳ නමරාගේ කට හඬ නැවත ඔහුගේ හිත තුළ දෝංකාර දෙන්නට විය. මෙවරද ලොකු දුවගේ පාසලේ මව්පිය දිනයට සහභාගි වෙන්නට නොහැකි විය. තාත්තා කෙනෙක් නැද්දැයි ඇසූ පංතිභාර ගුරුතුමිය සිහිවීමෙන් ඔහුගේ කටින් කුණුහරපයක්ද පිටවිය. පොඩි පුතාගේ මොන්ටිසෝරියේ විවිධ ප්‍රසංගයට ආපු නැති එකම තාත්තා මමලු. මාමණ්ඩි ඉස්පිරිතාලේ නවත්වපු වෙලාවේ බලන්න නොගියේ මං විතරලු. අක්කගේ දුගේ කොටහලු මඟුලට තනියෙන් ගියාම මිනිහෙක් නැද්ද කියලා නෑදෑයෝ ඇහුවාලු.

කෝප්‍රල් සොයිසාගේ ඔලුවට නැවතත් යක්ෂයා ආරූඪ විය. වීදිය දිගේ නිතඹ හලවමින් ලැසි ගමනින් යන රූහිරු ළඳුන් කවුලුව තුලින් ඔහුට පෙනී නොපෙනී ගියේය. බංකර් ඉස්සරහා තුවක්කුද අතැතිව තැන තැන වැටී සිටි කොටි කෙල්ලන්ගේ මළ සිරුරු ඔහුගේ ඇස් මානයේ දිස්වෙන්නාක් මෙනි.

මුන් ඔක්කෝටම තේරෙන්නේ නැති හැටි. අපි මේකේ වහ කාගෙන රාජකාරි නොකලනම් ඔය එකෙකුටවත් මෙහෙම ඉන්න පුලුවන්ද. ඔහු ගෙදර ගොස් තම බිරිඳට දෙන දේශණාවට හිතින් වචන එකතු කරන්නට විය.

අවන්හලේ බිල ගෙවා දැමූ සොයිසා වැනි වැනීම ගොස් බසයට ගොඩවුණේය. වෙහෙසක්, වෙරිමතත් නිසා ඔහු නින්නදට ගියේය. ගමනාන්තයේදී බසයෙන් බසින විටත් ඔහුට වෙරිය. වීදිය පාලුවට ගොසිනි. හිස පමණක් එසවූ බලු නාට්ටකු නැවත "ද" යන්න ගසාගෙන නින්දට වන්නේය.

ඉතිරි දුර ගමන් කිරීමට ඔහු ත්‍රිරෝද රථයට ගොඩවුණේ. රියදුරාගේ අනුකම්පාමුසු ගෞරව බැල්ම ඔහුට වදයක් විය. ගමන අවසානයේ ආපසු දුන් ඉතිරි මුදලද කෝප්‍රල් සොයිසා නොගත්තේය. බිරිඳට හොඳ පාඩමක් උගන්වන්නට සිතමින් තොල මතුරමින් ගොස් ඔහු දොරට තඩි බෑවේය. විදුලි පහනක් දැල්වී දොර විවෘත විය. සිහින් සබන් සුවඳක් නහය විනිවිද ගියේය. අලුත් රාත්‍රී ඇඳුමකින් සැරසී සිටි නමරා මොනවාදෝ කියනු සිහිනෙන් මෙන් ඔහුට ඇසිණි. කාමරයට එබුණු ඔහුට බෝනික්කාද තුරුලු කරගෙන සුවසේ නිදන දියණිය හා පුතා නෙත ගැටුණේය. ඇඳට අලුත් ඇතිරිල්ලක් දමා තිබුණේය. කෑම මේසය වට්ටියකින් වසා තිබුණේය. සාලයේ බඩුමුට්ටු පිළිවෙලකට තබා තිබුණේය. තම බිරිඳගේ මුහුණ දෙස බැලීමට අපහසු ගතියක් කෝප්‍රල් සොයිසාට දැනිණි. චොකලට් එකක් හෝ ගෙන ඒමට නොහැකි වූ බව මතක් වීමෙන් සිහින් ලැජ්ජාවකින් ඔහුගේ සිත වෙලී ගියේය. පුටුවක හරි බරි ගැහී නිදගත් ඔහු වරදක් කොට අසුවූ පොඩි එකෙක් මෙන් සිහින් හඬින් න..ම..රා යනුවෙන් මිමිණිය.

***කපිතාන් චන්දන ද සිල්වා ශ්‍රීලංකාවෙඩ***
*(2006 "රණවිරුවා" සැප්තැම්බර් සඟරාවේ පළවූ ලිපියක් ඇසුරිනි)*






## ඔබේ ලිපි/නිර්මාණ අප වෙත එවන්න...

විශේෂාංග රාශියකින් සමන්විත නව මුහුණුවරකින් එළිදක්වන රණවිරුවාහි ඔබගේ ලිපි, නිර්මාණ වෙනුවෙන් වැඩි ඉඩකඩක් වෙන් කෙරේ. ඔබ ඇසූ දුටු අත්විඳි ඕනෑම දෙයක් නිර්මාණශීලීව අප වෙත ලියා එවන්න. එසේ එවනු ලබන කවි, හිසදැස්, කෙටිකතා, ලිපි හා ඡායාරූප ආදිය (සුදුසු ඒවා) අප්‍රමාදව රණවිරුවාහි පලකිරීමට කටයුතු යොදා ඇත. ඔබේ නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක "රණවිරුවා"
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.
*ranaviruwa@yahoo.com*



# අතීත ලංකාවේ සංග්‍රාම නීති මූලාශ්‍ර

සංග්‍රාම නීති යනු සංග්‍රාමයකදී අනුගමනය කරන නැතහොත් සංග්‍රාමයකදී පිළිපැදිය යුතු යැයි සම්මත නීතිරීති හෝ සම්ප්‍රදායන්වල එකතුවකි. මේවා ඉතා පැරණිය. ඒ කෙසේද යත්, පෘථිවියේ ආරම්භය නැතහොත් ලොව මිනිසුන් බිහිවීම තෙක් දිවයන්නේය. මනුෂ්‍යයන් ලොව පහළ වූයේ කවදාද, ගැටුම් හා සංග්‍රාම ඒ හා සමගම ඇති වන්නට විය. එකල ඔවුනු නීති සම්ප්‍රදායක් ගැන දත හෝ නොදත යම්කිසි සීමාවන් සංග්‍රාමවලදී යොදාගත්හ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමාන ලෝකයේ යුද කටයුතුවලදී යොදාගන්නා නොයෙකුත් නීතිරීති හා සම්ප්‍රදායන් බිහිවී ඇත. එසේම, සංග්‍රාම නීතිය බිහිවූයේත්, මේ දක්වා විකාශනය වී ඇත්තේත්, යුදබිමේ සිටින සෙබළුන්ගේ අත්දැකීම් මත පිහිටා බව අමතක නොකළ යුතුය.

ලෝකයේ අනෙකුත් රටවල් හා සංසන්දනය කිරීමේදී ඉතා ශ්‍රේෂ්ඨ ඉතිහාසයකට ශ්‍රී ලාංකිකයන් උරුමකම් කියයි. මෙම ශ්‍රේෂ්ඨත්වයට මූලික හේතුව වී ඇත්තේ අතීතයේ පැවැති ස්වයංපෝෂිත බව, ශ්‍රී විභූතිය, ශ්‍රේෂ්ඨ සම්ප්‍රදායන්, කලා ශිල්ප හා සිංහලයන්ගේ එඩිතරභාවය යන කරුණු මත බව පැහැදිලි වේ

ලංකාවේ සංග්‍රාම ඈත අතීතයේ සිට එන බව ඓතිහාසික සාධක මගින් සොයාගෙන ඇත. එහෙත් සංග්‍රාමවලදී භාවිතා කළ නීතිරීති හෝ සම්ප්‍රදායන් ගැන විමර්ශණය කර හෝ සොයා බැලීමක් කළ කෙනකු සොයා ගැනීමට නැත. ලංකාවේ අතීත සංග්‍රාමයන් විමර්ශණය කිරීමේදී හා ජනප්‍රවාදයේ එන කරුණු ඔස්සේ සොයා බැලීමේදී අතීත සංග්‍රාමවලදී යම් යම් නීතිරීති සම්ප්‍රදායන් හා සීමාවන් තරමක් දුරට හෝ සටනට අවතීර්ණ වූ දෙපාර්ශ්වයේම හිත සුව පිණිස ආරක්‍ෂා කර ඇති බව පෙනේ.

ජිනීවා සම්මුතිය හෝ අනෙකුත් ජාත්‍යන්තර ගිවිසුම් ඇතිවී නොතිබූ කාලයක සංග්‍රාමයකදී සිදුවන ගැටුම් ශිෂ්ටසම්පන්න නොවූ ක්‍රියා මගින් රාජ්‍ය පාලකයන්ට, යුද පෙරමුණේ සෙන්පතියන්ගේ ශ්‍රේෂ්ඨත්වයට, පොදුවේ නියෝජනය කරන හමුදාවට අපකීර්තියක් අත්පත් වන බව ඔවුහු දැන සිටියහ. සිංහලයන් තුළ තම ජාතියට හෝ තම හමුදාවේ ගෞරවයට හානි වනවාට කැමැත්තක් නොතිබුණි.

සුදු කොඩිය යුද ඉතිහාසයේ පැරණිතම සම්ප්‍රදායන්ට අයත් වන්නා සේම, සැමවිටම යටත්වීමක් හෝ සටන් විරාමයක් ඉන් පෙන්නුම් නොකරයි. සටනට එළඹුනු පාර්ශ්වයන් අතර සාකච්ඡා පැවැත්වීම හෝ වෙනත් එවැනි කටයුතු සඳහා සතුරු පිල වෙත පණිවිඩ යැවීම සඳහා ද මෙය යොදාගනී. ලංකාවේ අතීත සංග්‍රාමවලදී එක් පාර්ශ්වයක් වෙත දූතයන් මගින් සංදේශ හුවමාරු කරගෙන ඇත. එහෙත් සතුරු පිලේ වුවද සංදේශයක් රැගෙන ආ දූතයන්ට හිරිහැර කර සිර භාරයට ගත් අවස්ථා විරල වන අතර, සතුරු පිලේ දූතයන්ට නිසි සැලකිලි දක්වා තමන්ගේ මතය ඔහු අත අනෙක් පිලට දැන්වීමට යොදාගෙන ඇත.

සටනේදී අල්ලාගත් සටන්කාමීන්ට මානුෂිකව සැලකීම වර්තමානයේ අනුගමනය කළ යුතු ජිනීවා සම්මුතියෙන් පිළිගෙන ඇත. අතීතයේ මෙලෙස අල්ලාගත් වරපුරුෂයන්ට වුවද අමානුෂික ලෙස සැලකීමට ධාර්මික රජවරු ඉඩලබා නුදුන්හ. වරක් වේළුසුමන යෝධයා මෙලෙස අල්ලාගත් වරපුරුෂයන් දෙදෙනකු රජු ලඟට ගෙනයාමට පෙර ඔවුන්ගේ කන් කපා දමා තිබුණි. මෙහිදී දුටුගැමුණු රජතුමා වේළුසුමනගේ මෙම ක්‍රියාව අනුමත නොකළ අතර, ඔහුට දඬුවම් පැමිණවීමට පවා කටයුතු කළේය. සංග්‍රාමයෙන් අනතුරුව සෙස්සන් සතුරන් ලෙස සැලකිය නොහැකි බවත්, මහා රණශූර "නැපෝලියන්" වරක් පවසා තිබුණි. මෙයින් වසර 2500 කට පෙර "සුන්ත්සු" තුමා පැවසුවේ සංග්‍රාමයකදී අත්අඩංගුවට පත් සතුරන්ට මානුෂිකව සැලකීම සතුරු හමුදාව ජය ගැනීමට උපකාරී වන බවයි.

සංග්‍රාමයක් පවතින අවස්ථාවලදී සිවිල් ජනතාව සහ ඔවුන් සතු දේපල ආරක්‍ෂා කිරීම ජිනීවා සම්මුතියෙන් සම්මත කරගත් සංග්‍රාම නීතියයි. අතීත ලංකාවේ සංග්‍රාමයක් පවතින අවස්ථාවලදී අවට ගම්බිම් විනාශ කිරීම, ස්ත්‍රී දූෂණ, දේපල වස්තුව කොල්ලකෑම සිංහල රණසේනාවලින් සිදුවුයේ අල්පමාත්‍ර වශයෙනි. මෙවැනි යුද්ධයට සම්බන්ධයක් නැති ගම්බිම්, දේපල, වස්තුව කොල්ලකෑම, ස්ත්‍රී දූෂණ ආදී අශිෂ්ට ක්‍රියාවන් දරුණු ලෙස සිදුකළේ මෙරට පැමිණි විජාතික පෘතුගීසි, ලංදේසි සහ ඉංග්‍රීසි හේවායන් විසිනි. මේ සම්බන්ධයෙන් ඔවුන් කළ විනාශයන් කිසිම නීතියකට හෝ ආගමකට අනුකූල නොවේ. සටනට අවතීර්ණ වූ පසු ආගමික සිද්ධස්ථානවලට හෝ සංග්‍රාමයේදී ආගමික වතාවත්වලට සම්බන්ධ පුද්ගලයන් ආරක්‍ෂා කිරීම සංග්‍රාම නීතියට එකඟ සම්මුතියකි.

කෝට්ටේ රාජධානිය පැවති සමයේ මහා රණශූරයකු වූ වීදිය බණ්ඩාර මුහුදුබඩ පළාත්වල පිහිටා තිබූ කතෝලික මිෂනාරි පල්ලි කීපයක් විනාශකළ බව ඉතිහාසයේ සඳහන් වේ. ඒ වීදිය බණ්ඩාරගේ චරිත ස්වභාවය මිස සටනට එළඹි සිංහල සේනාවගේ ස්වභාවය නොවන බව ප්‍රත්‍යක්‍ෂ වන්නේ, වීදියබණ්ඩාර බුවනෙකබාහු රජුගේ දියණිය වූ සමුද්‍රා දේවිය සරණපාවා දීමට නියමිතව සිටි ජයෝ බණ්ඩාර ඝාතනය කර ඉන් අනතුරුව තම දේවිය වූ සමුද්‍රා දේවිය ද ජලයේ ගිල්වා මැරෙන තුරු බලාසිටීමට තරම් තද සිත් ඇති, දුර්වල බුවනෙකබාහු රජුට පාලනය කර ගැනීමට ද අපහසු වූ පුරුෂයෙක් වූ නිසාවෙනි. එකල විජාතික සේනාවන් ලැගුම්ගෙන සිටි බලකොටුවල පියතුමන්ලා ආගමික කාර්යයේ නිරතව සිටි අතර, කිසිම යුද්ධයකදී ඔවුන් සිංහල සේනාවන් අතින් මැරුම් කෑ බවට සාක්‍ෂි නැත. එසේ වුවද බෞද්ධ සිද්ධස්ථාන පමණක් නොව ස්වාමීන් වහන්සේලා පවා පරදේශ සේනාව විසින් ඝාතනය කළ අවස්ථා ඉතිහාසයේ බොහෝය. කිරි දරුවන් උඩ දමා කඩුමුවහතින් ඇණ මරාදමා ප්‍රීතියක් ලැබීමට තරම් වූ අශිෂ්ඨයෝ ඒ අතර වූහ.

යුද්ධයක් වුවද කෲර සහ අමානුෂික ආකාරයේ මනුෂ්‍යඝාතනය කෙලෙසත අපරාධ අතීත සංග්‍රාමවලදී මෙරට හමුදාවන් අතින් සිදුවීයේ නම් කලාතුරකින් විය යුතුය. එක් පුද්ගලයකු වට කරගෙන විශාල හමුදාවක් විසින් අධික බලයක් යොදාගෙන ම්ලේච්ඡ ලෙස ඝාතනය කිරීම වෙනුවට අතීත ලංකාවේ සිදුවූයේ ද්වන්ද සටන්ය. යුද්ධයේදී පමණක් නොව අනෙකුත් අවස්ථාවලදීද, තම ප්‍රතිවාදියාට "අභියෝග" කිරීම තුළින් ද්වන්ද සටනකට ආරාධනා කරයි. එහිදී, සටනට පත් දෙදෙනාගෙන් අයකුගේ දිවිතොර වුවත් ඔහුගේ පාක්‍ෂිකයන් අනෙකාට පහරදීමට කිසිවිටෙකත් නොඑන තරමට ඔවුහු යුද සම්ප්‍රදායන් ආරක්‍ෂා කළහ. ඌව වෙල්ලස්ස කැරැල්ලේදී එය මැඩපැවැත්වීමට ඉංග්‍රීසි සේනාවට නායකත්වය ලබාදී ඌවට ගිය කැප්පෙටිපොල සෙන්පති එහිදී සිංහල සේනාවේ ඉල්ලීම මත කැරලිකරුවන්ට එකතු විය. මෙහිදී, සිංහල සේනාවන් සමග එකතු වී ඉංග්‍රීසි හටයින් සමූල ඝාතනය කර ඔවුන් සතු වටිනා අවි ආයුධ අත්පත් කරගැනීම ඉතා පහසු විය. එහෙත් තමා සිංහල සේනාවට එකතු වන බව කී කැප්පෙටිපොල සෙනෙවිතුමා ඉංග්‍රීසි හටයින් නිරුපද්‍රිතව ආපසු හරවා යැවීය. සතුරකු වුවද මරාදැමීමට වඩා අත්අඩංගුවට ගෙන රඳවා ගැනීමට සිංහල හටයින් සෑම අවස්ථාවකදීම ක්‍රියාකර ඇති බව ඉතිහාසය හෙළි කරයි. වරක් කෝට්ටේ රාජධානියේදී මහා රණශූර වීදිය බණ්ඩාර සීතාවක රාජධානිය ආක්‍රමණය කිරීමට ගොස් සිටියදී ලාබාල ටිකිරි බණ්ඩාර කුමාරයාට කොටු විය.

"සටන් කරනවාද? යටත් වෙනවාද?" ටිකිරි කුමරා ඇසීය.

"ඔබේ කැමැත්ත සටන් කිරීමටද? නැතහොත් මා යටත් වනවා දැකීමටද? වීදිය බණ්ඩාර ඇසීය.

ඔබ පරාජය කොට මරාදැමීම ඉතා පහසුයි. ඒත් මගේ කැමැත්ත ඔබ යටත්

වනවා දැකීමයි" ටිකිරි කුමරා කීවේය.

ඉන්පසු ටිකිරි කුමරා විසින් අත්අඩංගුවට ගනු ලැබූ වීදිය බණ්ඩාර තම පියා වූ සීතාවක මායාදුන්නේ රජු වෙත ඉදිරිපත් කළේය. තම රාජ්‍යය ආක්‍රමණය කිරීමට පැමිණි මෙම ආක්‍රමණිකයා දෙස රජු ඇඩි කෝපයෙන් බලා සිට මෙසේ ඇසීය.

"එම්බල වීදිය බණ්ඩාර ! පරම්පරාවෙන් මට උරුම වූ මගේ රාජ්‍යය ආක්‍රමණය කිරීමට තරම් තා එඩිතර වූයේ කෙසේද?"

"රජතුමනි, සමාවුව මැනව. යුද්ධයේදී පැරදී සිරභාරයට ගත් තැනැත්තාත්, යුද්ධයේදී ජයග්‍රහණය ලබා සිංහසනාරූඪව සිටින තැනත්තාත් අතර බරපතල වෙනසක් ඇති බව ඔබ දනී. මා නිදහස්ව සිටින විට ඔබ මය ප්‍රශ්නය ඇසුවේ නම් නිසැකවම ඊට පිළිතුරු ලබාදෙමි. එහෙත් මා ඔබට යටත් වූ සිරකරුවෙක් පමණකි" වීදිය බණ්ඩාර කීවේය.

ලංකාවේ අතීත සංග්‍රාමවලදී එහි සම්ප්‍රදායන් පිළිබඳව අසල්වැසි ඉන්දියානු බලපෑමද ලැබී ඇති බව පෙනේ. අතීත ඉන්දියානු යුද සම්ප්‍රදායන් වූ සෙන්පතිවරු සටන් වැදිය යුත්තේ සෙන්පතිවරු සමග පමණක් බවත් යන අතීත යුද නීති ලංකාවේදී බොහෝ විට එලෙසම සිදුවිය. එළාර රජුගේ සොහොන අසලින් ගමන් ගන්නවුන් පවා එයට ආචාර කළයුතු බවට නීතියක් පැනවීමට තරම් දුටුගැමුණු රජු ශිෂ්ට සම්පන්න විය.

"මගේ සටන සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස වේ. එය දෙමළ ජනයාට එරෙහි සටනක් නොවේ" දුටුගැමුණු රජු පවසා ඇත.

"සටනකදී භාවිතා වන යුද උපක්‍රම සහ අවි ආයුධ සීමා රහිත නොවේය" යන්න වර්තමානයේදී පිළිගත් සංග්‍රාම නීතියකි. අතීතයේදී මෙය නීතියක් ලෙස නොවූවත් තමන් අදහන ආගම හා දෙවියන් මුල්කොට සලකා සටන් වැදුන පෙරදිග රටවල සෙන්පතිවරු ස්වයං පාලනයකින් යුතුව සටන් වැද ඇති බවට සාක්ෂි මහා භාරත යුද්ධයේදී බ්‍රහ්මයකු වූ "දෝනාචාර්ය සෙන්පති" යුද්ධය බිහිසුණු අවස්ථාවක වෙනත් විකල්පයක් නොවූයෙන් මොහොතක් භාවනාවේ යෙදී අහසට අත දිගුකර දිව්‍යමය ආයුධයක් ලැබගෙන සතුරන් නසන්නට තැත් කළේය. එම අවස්ථාවේදීම දෙවියන් අහසේ දිස්වී මෙසේ කීවේය.

"දෝනාචාර්ය, දිව්‍යමය ආයුධ ලබාගැනීමට තරම් ඔබ ශිල්ප ප්‍රගුණ කළ රණශූරයෙක් බව සැබෑය. එහෙත්, දිව්‍ය ආයුධවලින් පහරදී සතුරන් සමූල ඝාතනය කිරීම ඔබ වැනි රණශූරයකුට තරම් නොවේ"


"එසේම වේවා..." කී දෝනාචාර්ය සෙන්පති දිව්‍යමය ආයුධ අතහැර සුපුරුදු අසිපත සුරතට ගෙන සටන් වැදුණි.

පිළිගත් බලගතු නීතියක් නැතත් තමන්ගේ හෘද සාක්ෂියට එකඟව සදාගත් ස්වයං පාලනයක් අනුව සටන් වැදීම ඉන්දියාවේ මෙන්ම ලංකාවේ රණශූරයන් අතරද දක්නට තිබුණි. ගැමුණු කුමාරයා යුද භූමියට සර්වඥ ධාතූන් වහන්සේලා වැඩම කරවූ බවද මතකයක් පවතී. එවන් නායකයන් මෙහෙය වූ සටනක ම්ලේච්ඡ ක්‍රියාවලට හෝ අමානුෂික ක්‍රියාවලට ඉඩ ප්‍රස්ථාව බොහෝ සීමිතය. අතීත හෙළ සංග්‍රාමවලදී සිංහලයන් අතින් පරසතුරන් සමූල ඝාතනවලට ලක්වූයේ නම් ඒ හුදෙක් භූමියේ වාසිය ගෙන කරන ලද රැකසිට පහරදීම්වලිනි. එසේ පැමිණි අවස්ථාවලදී මුල්ලේරියා වෙලට පෘතුගීසීන් කොටුකරගෙන පහරදී සමූල ඝාතනය කිරීමට ටිකිරි කුමරුට හැකිවිය. මේවා හුදෙක් සංග්‍රාම ක්‍රමෝපායන් විය. එයින් ජීවිතක්ෂයට පත්වූයේ හුදෙක් සටනට අවතීර්ණ වූ සටන්කාමීන් මිස යුද්ධයට සම්බන්ධ නොමැති පාර්ශ්වයන් නොවේ.

ලෝකයේ බොහෝ රටවල අද පවතින ගැටලුකාරී තත්වය මත සංග්‍රාම නීති රැකීම හා යුදබිමේ සෙබළුන් ඒ පිළිබඳව දැනුම්වත් කිරීම සෑම රටකටම අත්‍යවශ්‍යම කාර්යයක් බව පෙනේ. මන්ද, සංග්‍රාම නීති රැකීමෙන් මිනිස් වේදනාවන් හා අනවශ්‍ය විනාශ කිරීම් වැලකී ජනතාවගේ ප්‍රසාදය ලැබීමයි. එසේම, එවිට සාමය සඳහා හැමවිටම දොරක් විවෘතව පැවතීමයි. සංග්‍රාම නීති උල්ලංඝණය කර ආවේගශීලීව හිංසාකාරී ක්‍රියාවල නිරතවීමෙන් සතුරන් සටනට දිරිගන්වන අතර, තම හමුදාවේ අභිමානය හා ජාත්‍යන්තර වශයෙන් ලැබෙන උදව් උපකාරවලට හා ගෞරවයටද සිදුවිය හැකි හානිය වළක්වා ගැනීමට හැකිවීම එහි ඇති විශේෂත්වයයි.



කර්නල් එම්පීපී පෙරේරා
(විශ්‍රාමික)









# වකුගඩු සැත්කමෙන් ගිනස් පොතට ගිය වෛද්‍යවරයා

රෝගියකුගේ වකුගඩුවක සෑදී තිබූ බරින් වැඩිම සහ දිගින් වැඩිම ගලක් සැත්කමකින් සාර්ථකව ඉවත් කර ගිනස් වාර්තාවක් පිහිටුවීමට පසුගිය දා ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍යය කණ්ඩායමක් සමත් වූහ. මෙලෙස ඉවත් කෙරුණේ බරින් ග්‍රෑම් 801 ක් සහ දිගින් සෙන්ටිමීටර් 13.3 කට වැඩි බරකින් යුතු ගලකි. නාරාහේන්පිට පිහිටි යුද්ධ හමුදා රෝහලේදී පසුගියදා සිදුකෙරුණු මෙම සැත්කම සඳහා එහි මූත්‍ර ලිංගික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය ලුතිනන් කර්නල් කේ සුදර්ශන්ගේ ප්‍රධානත්වයෙන් වෛද්‍ය කපිතාන් සුපුන් පතිරත්න, වෛද්‍ය කපිතාන් තමාෂා ප්‍රේමතිලක ඇතුළු වෛද්‍ය කණ්ඩායමක් දායක වූ අතර, එහි නිර්වින්දන වෛද්‍යවරු වශයෙන් වෛද්‍ය කර්නල් යූඑල්බී පෙරේරා සහ වෛද්‍ය කර්නල් සීවස් අබේසිංහ දායකත්වය සැපයූහ. මෙම සැත්කම සිදුකළ යුද්ධ හමුදා රෝහලේ මූත්‍ර ලිංගික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය ලුතිනන් කර්නල් කේ සුදර්ශන් සමග මේ පිළිබඳව සංලාපයක යෙදෙන්නට අපට හැකියාව ලැබිණ. මේ ඔහු සමග සිදුකළ කතාබහයි.

### ඔබව අපට හඳුන්වා දෙන්න හොඳම විදිහ මොකක්ද ?

මම විශේෂඥ වෛද්‍ය කේ සුදර්ශන්. මම අධ්‍යාපනය ලැබුවේ යාපනය සාන්ත ජෝන් විදුහලෙන්. මගේ වෛද්‍ය උපාධිය ලබා ගත්තේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන්. පස්සේ මම කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් වැඩිදුර අධ්‍යාපනය හදාරලා වසර 2015 සිට වසර 2017 වෙනකම් වසර දෙකක් බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර පිහිටි කිංග්ස් කොලේජ් රෝහලේ විදෙස් අධ්‍යාපනය හැදෑරුවා.

ඊට පස්සේ මම ලංකාවට ඇවිල්ලා මුලින්ම නාගොඩ රෝහලේ වැඩකලා. ඊට පස්සේ අවුරුදු දෙකක් අම්පාර රෝහලේ වැඩ කළා. එතනින් පස්සේ 2020 වසරේදී යුද හමුදාවට බැඳිලා වසර දෙකක සිට යුද හමුදා රෝහලේ සේවය කරනවා.

### ඔබ යුද්ධ හමුදාවට බැඳුනේ ඇයි?

ඇත්තටම මම ඔය යුද්ධ හමුදාව සමග පූර්ණකාලීනව එකතුවෙලා අවුරුද්දයි මීට කලින් සතියකට දවසක් තමයි මම යුද්ධ හමුදා රෝහලට ආවේ. ඒ මම එන කාලේදී මට තේරුණා යුද හමුදා සාමාජිකයින් විශාල ප්‍රමාණයක් මොත්‍ර ලිංගික පද්ධතිය ආශ්‍රිත රෝගවලින් පෙළෙනවා  කියලා. මට අවශ්‍ය වුණා ඔවුන් වෙනුවෙන් පූර්ණකාලීනව සේවය කරන්න ඒ නිසා තමයි මම යුද්ධ හමුදාවට එකතු වුණේ.

### මේ සැත්කමට භාජනය කළ රෝගියා පිළිබඳව දැන ගත්තේ කොහොමද ?

ඔහු යුද හමුදාවේ සේවය කරලා විශ්‍රාම ගිය සොල්දාදුවෙක්. මෙම රෝගියාට 2015 වසරේ වගේ ඉඳලා යම් යම් වේදනාවන් ඇති වෙලා ප්‍රතිකාර අරගෙන තියෙනවා. නමුත්, ඔහු නිසි ප්‍රතිකාර ලබාගෙන නැහැ. ඔහු යුද්ධ හමුදා රෝහලට ආවේ පසුගිය මැයි මාසේ ඔහුගේ රෝග ලක්ෂණ අනුව අපි ඔහු පිළිබඳව පරීක්ෂණ කිරීම ආරම්භ කලා. ඒ අනුව ඔහුව යුද හමුදාවේ තියෙන රේඩියෝලොජි ඩිපාර්ට්මන්ට් එකේ තමයි මුලින්ම ස්කෑන් එකක් කරලා තහවුරු කරගත්තේ වකුගඩු ආශ්‍රිත විශාල ගලක් මොහුගේ වර්ධනය වෙලා තියෙනවා කියලා. ඊට පස්සේ සීටී ස්කෑන් එකේදී අපිට නිරීක්ෂණය වුණා සෙන්ටිමීටර් 13.2 ක ප්‍රමාණයක ගලක් තියෙනවා කියලා. ඊට පස්සේ අපි මේ ගල ඉවත් කිරීම ඒ සඳහා රෝගියා සූදානම් කිරීම සහ අපි සූදානම් වීම සිදු කලා .

### මෙක ගිනස් පොතට යන වාර්තාවක් කියල ඔබ දැනගෙන හිටියාද?

ඇත්තටම මේ පිළිබඳව අපි ස්කෑන්වලදී දැනගත්තා. මෙච්චර කල් ලෝකයේ තිබුණු වාර්තාව තමයි 2004 වර්ෂයේ ඉන්දියාවේ මුම්බායි හිදී රෝගියෙක්ගෙන් ඉවත් කරපු සෙන්ටිමීටර 13 ක් දිග වකුගඩු ගලක්. ඒ වගේම පස්සේ අපිට දැනගන්න ලැබුණා මීට පෙර ගිනස් වාර්තාවට හිමිකම් කියපු වකුගඩුවකින් ඉවත් කරපු විශාලම ගලේ බර ග්‍රෑම් 620ක් කියලා. ඒක 2008 වසරේ දී පාකිස්ථානයේ පුද්ගලයකු ගෙන් වාර්තා වෙලා තිබුනේ.

*"මම යුද්ධ හමුදාවට බැඳුණේ 1995. මම දිගටම රාජකාරි කලේ උඩහ පැත්තේ. මම නන්දිකඩාල් දක්වාම යුද්දෙ හිටියා. මම 2009 තමයි විශ්‍රාම ලබාගත්තේ. ඒ කාලෙත් මට වරින්වර බඩේ කැක්කුමක් ඇතිවුණා. මම පැන්ෂන් ගියාට පස්සේ මේ බඩේ කැක්කුම ලොකුවට දැනෙන්න පටන් ගත්තා. මම 2023 දී තමයි සුදර්ශන් සර් ළඟට බෙහෙත් ගන්න ආවේ. සර් මාව පරීක්ෂා කරලා තමයි මගේ වකුගඩුවේ ගලක් තියෙනවා කියලා කිව්වේ. ඊට පස්සේ පහුගිය පලවෙනිදා මගේ ඔපරේෂන් එක කළා. දැන් කිසිම ප්‍රශ්නයක් නෑ. මට දැන් ලොකු සහනයක් තියෙනවා. දැන් මට 100% ක් සනීපයි කියලා දැනෙනවා."*

- කැනිස්ටස් කුංගේ
(සැත්කමට භාජනය වූ රෝගියා)





සැත්කමෙන් ඉවත් කරන ලද ගල

**කොහොමද ගිනස් වාර්තාවක් වෙනුවෙන් මේ වගේ සැත්කමක් සූදානම් කළේ ?**

ඒක දීර්ඝ ක්‍රියාවලියක්. අපි මුලින්ම මේ පිළිබඳව සැලසුම් කළා. ඉන් පසුව මේ සම්බන්ධයෙන් අපේ යුද්ධ හමුදා රෝහලට සම්බන්ධ මොත්‍ර විශේෂඥ වෛද්‍යවරු දෙන්නෙක් මේ කටයුතු නිරීක්ෂණය කළා. ඒ වගේම සියලුම දේ සිදුකළේ ගිනස් කමිටුවේ නිරීක්ෂණවලට යටත්වයි.

**මෙම ශල්‍යකර්මයට පෙර සූදානම කොහොමද සිදුකළේ?**

මේක රෝගියාගේ දකුණුපස වකුගඩුව විවෘත කරලා කරන Right Side Pyelolithotomy කියන ශල්‍යකර්මය. අපි රෝගියාට ඇතිවිය හැකි සියලුම සංකූලතා පිළිබඳව සොයා බලා සූදානම් වුණා. ඩයලිසිස් කරන්න පවා සූදානම් වෙලා හිටියේ. දැඩි සත්කාර ඒකකයේ ඇඳක් සූදානම් කළා. නිර්වින්දන වෛද්‍යවරු දෙදෙනෙක් සහ වෙනත් වෛද්‍යවරුන් තුන්දෙනෙක් සහිත පස්දෙනකුගෙන් යුත් කණ්ඩායමක් අපි සූදානම් කළා. මොකද මෙම සැත්කම ගොඩක් වගකීමෙන් කරන්න ඕන සැත්කමක්. ඒවගේම මේක අපිට ලොකු අභියෝගයක් වුන ශල්‍යකර්මයක්.

**මේ වගේ ශල්‍යකර්මයකින් පසුව මොනවගේ සංකූලතා ඇතිවෙන්න පුළුවන්ද?**

විශේෂයෙන්ම වකුගඩුවලට හානි වෙන්න පුළුවන්. නමුත්, රෝගියාට එවැනි කිසිදු සංකූලතාවක් ඇති වුණේ නැහැ. ඒ වගේම තමයි මේ රෝගියා කිසිඳු වෙනත් රෝගයකින් පීඩාතොවීම අපේ ශල්‍ය කර්මයට තවත් පහසුවක් වුණා.

**ඇත්තටම මේ වගේ වකුගඩු ආශ්‍රිත ගලක් ඇතිවීමට ප්‍රධාන හේතු මොනවාද ?**

මේ රෝගියා ඔහුගේ යුද හමුදා සේවා කාලයේ වැඩි කාලයක් උතුරු නැගෙනහිර පළාත්වල සේවය කරලා තිබුණා. ඒ ප්‍රදේශයේ වතුර ප්‍රධාන සාධකයක් වෙලා තියෙනවා. ඒ වගේම දෛනිකව අවශ්‍ය පානීය ජලය ප්‍රමාණවත්ව ලබානොගැනීම තමයි තවත් ප්‍රධාන හේතුවක් වෙන්නේ. අනෙක් සුවිශේෂම කාරණය තමයි ශ්‍රී ලංකාව පිහිටලා තියෙන්නේ මුත්‍රා පද්ධතිය ආශ්‍රිත ගල් ඇතිවීම වැඩිපුරම වාර්තා වන කලාපයේ අපි ඉන්නේ 'world stone belt' තියෙන කලාපයේ මේ කලාපයේ පවතින කාලගුණික දේශගුණික සාධක සහ සමාජ තත්ත්වයන් නිසා මේ කලාපය රතු කලාපයක් විදියට හඳුන්වනවා.

**යුද්ධ හමුදා සාමාජිකයන් අතර මොත්‍ර ලිංගික පද්ධතිය ආශ්‍රිත රෝග වැඩිපුර වාර්තා වෙනවාද?**

ඔව්. මට එවැනි රෝගීන් විශාල ප්‍රමාණයක් වාර්තා වෙනවා. මම යුද්ධ හමුදාවට බැඳුණු ප්‍රධානම හේතුවත් මේ කාරණය තමයි.

**එලෙස වාර්තා වීමට ප්‍රධාන හේතු මොනවාද?**

ඔවුන්ට රාජකාරී අතරතුර පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ දුෂ්කරතා මතු වෙන්න පුළුවන්. අපි මේ සැත්කම කරපු රෝගියාත් වැඩි කාලයක් සේවය කරලා තිබුණේ උතුරු නැගෙනහිර පළාත්වල. ඒ ප්‍රදේශවල ජලයේ තිබෙන කඨිනතාවය තමයි මේ වගේ තත්ත්වයක් ඇතිවෙන්න ප්‍රධාන වශයෙන් බලපාන්නේ.

**මේ තත්ත්වය යටතේ යුද හමුදා රෝහල සූදානම් ද ඔවුන් සඳහා පූර්ණකාලීන ප්‍රතිකාර ලබා දෙන්න?**

ඔව් අපි සූදානම්. අපි මීට පෙර මෙවැනි සැත්කම් සඳහා අපේ රෝගීන් ජාතික රෝහලට යොමු කළා. නමුත්, දැන් අපි ලිංගික පද්ධති ආශ්‍රිත කිසිම රෝගියෙක් ජාතික රෝහලට යොමු කරන්නේ නැහැ. ඔවුන්ගේ සැත්කම් සඳහා සියලුම පහසුකම් අද වෙනකොට යුද්ධ හමුදා රෝහල සතුයි.

**අපි දැන් මේ ගිනස් වාර්තාව පිළිබඳව කතා කරමු. යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ මෙවැනි සැත්කමක් මීට පෙර කළා කියලා වාර්තා වෙනවද?**

නෑ මේ තරම් විශාල වකුගඩු ආශ්‍රිත ගලක් යුද හමුදා වෛද්‍ය බලකායේ වෛද්‍යවරුන් විසින් සාර්ථකව ඉවත් කරපු පළවෙනි අවස්ථාව තමයි මේ. ඒ වගේම මේක ශ්‍රී ලංකා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව ලෝකයට කියන්න හොඳම අවස්ථාවක්. යුද්ධ හමුදාව සහ රටක් විදිහට අපි ලෝකය ඉදිරියේ ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක්. ඒ වගේම තමයි වෛද්‍ය විද්‍යාත්මක කාරණයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට හිමි වූ පළවෙනි ගිනස් වාර්තාව තමයි මේ. ඒ අභිමානය රටට අරන්දීම යුද හමුදාව වශයෙන් අපිට විශාල ආඩම්බරයක්.

**මෙවැනි රෝග තත්වයන්ගෙන් වැළකෙන්න මොනවගේ පියවර ද අනුගමනය කරන්න ඕනේ?**

ප්‍රධානම දේ තමයි පිරිසිදු පානීය ජලය දෛනිකව අවශ්‍ය ප්‍රමාණයට ලබා ගැනීම.

**මේ සැත්කම සම්බන්ධයෙන් ඔබට යුද්ධ හමුදාධිපති ප්‍රණාම පදක්කම හිමි වුණා නේද?**

ඔව්... යුද්ධ හමුදාධිපතිතුමා මාව මේ ගිනස් වාර්තාව ලබාගැනීමෙන් පසුව කැඳෙව්වා. යුද්ධ හමුදාධිපති ප්‍රශංසා පදක්කම ලබාදුන්නා. ඒ ගැන මම ඇත්තටම සතුටු වෙනවා.




සටහන -:
ලුතිනන් දිලංක ගුණතිලක
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

# සෙබළ සිතුවිලි



## ආදරණීය බිරිඳ...

ජීවිතයේ එක් නිමේෂයක හමුවී
ඔබ මා... මා ඔබ... නොව එකකු ලෙසින්
මේ පුංචි ලෝකය තුළ අත්වැල් බැඳ ගත්තේ
ඉතාමත් ලෙන්ගතුකමිනි...
ඒ ලෙන්ගතුකමේ මිහිරියාවෙන්
ඔබ මා මේ ගෙවන සොඳුරු ජීවිතය තුළ
සදාකාලික ලෙසින් බැඳී සිටින්නේ
ආදරය නම් වූ සෙනෙහස් සයුරේ
සාඩම්බර අයිතිකරුවන් ලෙසින්
ඔබට මාවද මට ඔබවද නොමැතිව
මේ ජීවන කතර තුළ ගෙවන සෑම තත්පරයක්ම
ඔබ මා වෙනුවෙන් ද මා ඔබ වෙනුවෙන්ද
කැපකරන බව ආදරයේ නාමයෙන් මා දන්නෙමි...

සෙ/4වන්00564
සැරයන් සම්පත් කුමාර එච්ච්වන්
4 ශ්‍රීලයුයුබ

## උතුරේ වෙසක් සිරි...

එදා යුදගිනි ඇවිළුනා මෙහි
වෙසක් දිනයෙත් එක ලෙසේ...
ඒත් අද මෙහි දැකිය හැකිවෙයි
සාමයේ අරුණාළු දැයේ...
සිහල, මුස්ලිම්, දමිළ සැමදෙන
එකා පිටුපස එක ලෙසේ...
ඉරණමඩු හංදියේ දන්සැලේ
අසිරියයි මා පළකලේ...

සෙ/318945
ලා/කෝප්‍රල් සම්පත් කුමාර ටීච්චම්
6 ශ්‍රීලපාහ

## කිරිසිනා හරි හැඩයි...

සා පැටවියක වලස, ගේ පුරා දුවා පනින
කිරි සිනා හැඩයි, මගේ සිතම සනසවන
තාත්තගේ සුදු මැණික, ආච්චි සීයගෙ රන් මැණික
නුඹ මගේ මුළු ලොවම, රැකගනිමි දුවේ නුඹ
මාගයන් වන් මිනිස් කැළ මැද...

සෙ/2ආර්03251
ලා/කෝප්‍රල් කලනාණි ඩබ්ලිව්ජීවන්
2(සේවා) ශ්‍රීලයුකාබ

## අපේ යුද්ධ හමුදාව...

ජීවන ගමන් මගේ, ආවගිය තැන් අතර
සදා මතකයේ රැඳුණ, සොඳුරු නවාතැන්පලකි
අපේ යුද්ධ හමුදාව...

සෙ/335876
පාසෙ මධුසංක ජේවමිකේ
20 ශ්‍රීලපාහ

## තනිකම අරක්ගෙන...

රූපෙන් ආඩම්බර නැති
ඉහළටම ගියත්
නිහතමානිකමේ
වෙනසක් නැති
ලෝකෙටම පේන්න
බොරු මවාපෑම් නැති
ගැහැණුන් ලස්සනයි
ආදරණීය ගති පැතුම් ඇති...

ජීවිතයේ හොඳම කාලය
සොයායන්නට
නරක කාලය සමග
ඉදිරියට යා යුතුය...

එක් දිනක
එක් නිසල රැයකදී
තනිව හිඳ
සිහිකලෙමි මා
කිමද සිනහව
නොදුටු නෙත්මග
කඳුල හා
තනිකම අරක්ගෙන

සෙ/651609
සැරයන් ජයරත්න ඒචම්
රණවිරු සේවන - රාගම

## සසර හුරුකමට...

සසර හුරුකමට බැඳුනත් පෙමින්
ලංවී ඉන්නට පැතුවත් සිතින්
ළංඋනා ඔබ නොසිතූ ලෙසින්
කැදලි වී තුටු උනා දෙසිතින්...

කලක් ගතවිය දෙදෙනා තුටින්
උනා දෙදෙනා තුන්දෙනා ඉතිං
දැනුන සතුටක් දෝර ගලමින්
වැඩුණා පොඩි පුතු සුරතලය පාමින්...

සෙ/ආර්102471
කාසෙ ජිනදාස ජේවීපී - 2(සේවා) ශ්‍රීලයුකාබ

## මගේ සුදු දෝණී...

පෙමින් වෙලිලා කාලයක්
උනත් නෑ කිසි පාලුවක්
හිඳිනෙමි තව නීල මැණික්
ඒ අපේ රන් දියණියක්...

තැවුල් දුරලූ රන් කඳක්
උනා නුඹ මට පුර හඳක්
මටම මවාලූ පින් කඳක්
මගේ වුන රන් දියණිය...

ප්‍රේමයට නම එක නමක්
හදින් නැගෙනා හිමි නමක්
සෙනෙහේ ගලනා පෙම් ගඟක්
නුඹ නොවෙද සුදු දෝණියේ...

සෙ/485517
සැරයන් අජිත් කුමාර ඒසී - 20 ගරෙ

## සුවඳ දැනෙනවා...

වරු ගණන් මුමුණාපු
තැන්වලත්
ලස්සනට මල් පිපෙනවා...

පැය ගණන් හෙවන දුන්
රුස්ස ගස්
තවම ඒ වගෙ තියෙනවා...

දින ගණන් වැයකෙරූ
බංකුවක් මත
මතක කන්දක් තියෙනවා...

නුඹ නැතත් අද
පුරුදු තැන්වල
සුවඳ තවමත් දැනෙනවා...

සෙ/පී100596
පුසෙ නුවන් හසංක කේකේ




# ජීවන කුසලතා

මනුෂ්‍ය වර්ගයාගේ පැවැත්ම මානව සංහතියේම ක්‍රියාකාරී හා ස්වාභාවික ජීවනචක්‍ර ක්‍රියාදාමය තුළ රඳා පවතී. මෙම ක්‍රියාදාමය තුළ ඇතිවන වෙනස්වීම හේතුකොටගෙන දියුණුව හෝ පරිහානිය නමැති සිද්ධාන්ත දක්වා ලොව ගමන් කරයි. ඈත අතීතයේ සිට මෙම නූතන දියුණු යැයි කියාගන්නා සමාජයේ පැවැත්ම සඳහා මිනිසා විසින් නොදැනුවත්වම හෝ දැනුවත්කමින් ඉස්මතුවී තිබූ ලක්ෂණ සමුදායක් මිනිසා තුළ පවතී. මෙය ජීවන කුසලතා නමින් හඳුන්වන අතර කතාබහට පත්වූ විෂයක් මෙන්ම පාසල් විෂයක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

මේ අනුව සමාජ විද්‍යාඥයින් විසින් හඳුනාගෙන ඇති ජීවන කුසලතා කිහිපයක් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කැමති අතර ඒ තුළින් තම ජීවිතය හා තම දරුවන්ගේ ජීවිතවල අනාගතය සාර්ථකව ගතකිරීමට හා සාර්ථක මිනිසකු සමාජයට දායාද කිරීමට අදිටන් කරගන්න. මෙම කුසලතා පෞද්ගලික ජීවිතයට කොතරම් සමීපදැයි ඔබගේ ජීවන රටාව අනුව සසඳන්න. එවිට ඔබට හා ඔබේ පවුල් සමාජයට මෙන්ම රටට දියුණු සමාජයක් ගොඩනැගිය හැකි බව මම විශ්වාස කරමි.

**1. නිවැරදි තීරණ ගැනීම - *Correct Decision Making***

තම ජීවිතයේදී ගන්නට ලැබෙන තීරණ පෞද්ගලික හා රාජකාරීවලදී නිසි අයුරින් අවස්ථානුකූලව නිවැරදිව ගැනීමට සැමවිටම උත්සාහ කරන්න.

**2. ගැටළු නිරාකරණය කිරීම - *Problem Solving***

මේ සඳහා ඔබගේ ජීවන රටාවට සුදුසු ක්‍රමවේදයක් භාවිතා කළ හැක. ඉන්පසු මෙම ගැටළුව පහත පස් වැදෑරුම් ලෙස බලන්න.

1. නිවැරදිව හඳුනා ගැනීම
2. හඳුනාගත් ගැටළුව සඳහා විකල්ප තෝරා ගැනීම
3. උචිත විකල්ප තෝරා ගැනීම
4. තෝරාගත් විකල්පය අනුව ගැටළුව විසඳීම
5. ප්‍රතිඵලය දෙස බැලීම

**3. නිර්මාණශීලී චින්තනය – *Creative Thinking***

යමක් දෙස හොඳ අදහසකින් බැලීම.

**4. උපායශීලීව ක්‍රියාත්මක කිරීම හා තැනට සුදුසු නුවණ - *Tactfull Philosophy***

**5. විශ්ලේෂණාත්මක චින්තනය - *Analytical Philosophy***

මේ යටතේ පහත සඳහන් තීරණ සැලකිල්ලට ගන්න.

1. තර්කානුකූලව සිතීම
2. පාක්ෂික නොවීම
3. මධ්‍යස්ථව සිතීම
4. පූර්ණ නිගමන වලින් තොරව කටයුතු කිරීම
5. ලද දෙයින් සතුටුවීම

**මොහොතක් සිතන්න. ඔබ ඔබේම ජීවිතය සාර්ථක කරගැනීමට මෙතෙක් මෙවැනි දෙයක් උපයෝගී කරගෙන නොමැති නම්, ඔබ තුළ ඇති ජීවන කුසලතා ජීවිතය සාර්ථක කර ගැනීමට වැඩිදියුණු කර ඒවා උපයෝගී කරගෙන සාර්ථක වන්න.**



**6. ඵලදායී සන්නිවේදනය - *Good Communication***

1. නිවැරදි භාෂාව භාවිතය
2. නිරවුල් නිවැරදි ප්‍රකාශන ප්‍රකාශ කිරීම
3. සරලව ඉදිරිපත් කිරීම
4. දෙවරක් සිතා එක් වරක් කථා කිරීම

**7. යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා - *Inter Personal Relationships***

1. මිත්‍රශීලී බව හා සුහදශීලී බව
2. ප්‍රසන්න වචන කථාකිරීම
3. කණ්ඩායම් හැඟීම *(Team Work)*

**8. ස්වයං අවබෝධය - *Self Understand***

තමාගේ හැකියාව සහ නොහැකියාව පිළිබඳ අවබෝධය හා කළයුතු දේ නොකළ යුතු දේ අනුව ක්‍රියාකිරීම.

**9. අනුවේදනය - *Empathy***

අන් අයව තේරුම් ගැනීමේ හැකියාව

**10. චිත්තාවේගයට මුහුණදීම - *Cooping with Empathy***

හැඟීම් හඳුනාගෙන කටයුතු කිරීම මෙයින් පිළිබිඹු වේ. හැඟීම්වලට වහල් නොවී ක්‍රියාකිරීම.

**11. මානසික ආතතියට මුහුණදීම - *Mental Deprecation***

මෙය ඉතාමත් වැදගත් සිද්ධාන්තයක් වන අතර මේ සඳහා

1. විවේකීව සිටීම
2. සුහද අදහස් හුවමාරුව
3. කියවීම, මිත්‍රශීලීව බැලීම, හිත ගැනීම
4. හොඳ දේ අනුකරණය කිරීම

භාවනාව යන කරුණු මුල් කරගෙන ක්‍රියාකිරීමෙන් සාර්ථකව මේ සඳහා මුහුණදීමේ හැකියාව ලැබේ.

ඉහත සඳහන් කරුණු ඔබ තුළ තිබේදැයි මොහොතක් සිතන්න. ඔබ ඔබේම ජීවිතය සාර්ථක කරගැනීමට මෙතෙක් මෙවැනි දෙයක් උපයෝගී කරගෙන නොමැති නම් ඔබ තුළ ඇති ජීවන කුසලතා ජීවිතය සාර්ථක කර ගැනීමට වැඩි දියුණු කර උපයෝගී කරගෙන සාර්ථක වන්න. ඒ තුළින් ඔබත් සමාජයත් පොදුවේ රටත් ඉතාම කඩිනමින් දියුණුව කරා ලංවන බැව් ඉඳුරාම කිව හැකිය.

සටහන -:
මේජර් එස්ඩීපී රණසිංහ - ශ්‍රීලපාහ



## සාපේක්ෂතාවාදය

යුද අභ්‍යාස විද්‍යාලයේ අවසාන වසර පරීක්ෂණයට පෙනී සිටීමේ දිනය ළංවන්නම මැක් ආතර් සෙනෙවියා බියට පත්විය. හේතුව වූයේ අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදය පිළිබඳ කරුණු විභාගයට ඇතුළත්ව තිබීම නිසාය.

මේ කරුණු විසඳාගැනීමට මැක් ආතර් කළේ සාපේක්ෂතාවාදයේ විභාගයට අදාළ කොටස මුළුමනින්ම කට පාඩම් කරගැනීමය. සම්මුඛ පරීක්ෂණයේදී ඉතාමත් විචක්ෂණ ආකාරයට පිළිතුරු දුන් මැක් ආතර් සාපේක්ෂතාවාදය ගැන වූ ප්‍රශ්නයේදී කට පාඩම් කරගත් කොටස එහෙම පිටින්ම කියා නිම කළේය.

"ඔබට සාපේක්ෂතාවාදය තේරෙනවාද ?" යි ජෙනරාල්වරයා ඇසීය.

"පොඩ්ඩක්වත් නෑ..."

"මටත් මෙලොව දෙයක් තේරෙන්නේ නෑ" යි ජෙනරාල්වරයා කීය.


ක්‍රීඩා
විත්ති

# '10th Damso International Chess Festival 2023' හි ජය යුද්ධ හමුදාවට



දේශීය සහ විදේශීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් 500 කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් දින හයක් පුරා පැවති '10th Damso International Chess Festival 2023' තරඟාවලියේ සම්මාන ප්‍රදානෝත්සවය මැයි මස 27 සිට 30 දින දක්වා හික්කඩුව Lavanga Resort and Spa හෝටල් පරිශ්‍රයේදී පැවැත්විණි. එහිදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම විශිෂ්ඨ දක්ෂතා දක්වමින් රජයේ සහ වෙළඳ සේවා කාණ්ඩයේ ශූරතාවය දිනාගැනීමට සමත්විය.



# බිලියඩ් සහ ස්නූකර් ජයක්







ශ්‍රී ලංකා බිලියඩ් සහ ස්නූකර් සංගමය මගින් සංවිධානය කරන ලද 08 වන ජාතික බිලියඩ් තරගාවලිය ඉකුත් මැයි 15 සිට 30 වන දින දක්වා ජාතික සංගම් ක්‍රීඩාගාරයේදී සහ කොළඹ ඔටෝ මොබයිල් ක්‍රීඩාගාරයේදී පැවැත්විණ. ඊට සහභාගී වූ යුද්ධ හමුදා බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩා කමිටුවේ සෙ/751840 බනි I එස්ජී සුසන්ත විකුම් එහි ජාතික අනුශූරතාවයද, සෙ/එස්106061 ලා/කෝ මුබීන් එම්එම් එහි තෙවන ස්ථානයද හිමිකරනු ලැබූහ. එමෙන්ම, ශ්‍රී ලංකා බිලියඩ් සහ ස්නූකර් සංගමය මගින් සංවිධානය කරන ලද 6 වන ජාතික RED ස්නූකර් තරගාවලියද ඉකුත් මැයි 09 වන දින දක්වා (කොළඹ) ජාතික සංගම් ක්‍රීඩාගාරයේදී පවත්වන ලද අතර, ඊට එක්වූ යුද්ධ හමුදා බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩා කමිටුවේ සෙ/එස්106061 ලා/කෝ මුබීන් එම්එම් ජාතික අනුශූරතාවය හිමිකරගැනීමට සමත්විය.

# යුද්ධ හමුදා වෙරළ වොලිබෝල් (Beach Volleyball) තරඟාවලිය







SUNQUICK ආයතනයේ පූර්ණ අනුග්‍රහයෙන් ජාතික වෙරළ වොලිබෝල් තරගාවලිය පසුගිය මැයි 19 සිට 21 වන දින දක්වා මීගමුව (Browns Beach) වෙරළ උද්‍යානයේදී පැවැත්විණ. එහිදී, තරගාවලියේ සමස්ත අනුශූරතාවය හිමිකරගැනීමට යුද හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත්වූහ.






# ධාවන පැදි තරඟාවලියේ ජය යුද්ධ හමුදාවට

ශ්‍රී ලංකා මෝටර් සයිකල් ක්‍රීඩා සමාජය (SLMCC) මගින් සංවිධානය කරනු ලැබූ SLMCC ANNIVERSARY 03 ROUND CHAMPIONSHIP මෝටර් රථ හා ධාවන පැදි තරඟාවලිය පසුගිය මැයි 27 වන දින මීරිගම කත්වේඹරෝඩ්‍රෝම් ධාවන පථයේදී පැවැත්විණ. එම තරඟාවලියේ SM - Super Motard 250/450 cc Event ඉසව්ව සඳහා සහභාගී වූ යුද්ධ හමුදා මෝටර් රථ ක්‍රීඩා කමිටුවේ සෙ/680289 කෝප්‍රල් මධුරංග බීඅයි - ශ්‍රීලයුපොදුසේබ එහි ශූරතාවය හිමිකර ගත්තේය.



# බැඩ්මින්ටන් ඉසව්වෙන් යුද්ධ හමුදාවට විශිෂ්ට ජයක්

ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් සංවිධානය කරන ලද 12 වන ආරක්ෂක සේවා බැඩ්මින්ටන් තරඟාවලිය පසුගිය මැයි 29 සිට 31 වන දින දක්වා AFHMC ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය තුම්මුල්හිදී පැවැත්විණ. එහි කාන්තා හා පිරිමි කණ්ඩායම් ශූරතාව දිනාගැනීමට යුද්ධ හමුදාව නියෝජනය කළ ක්‍රීඩක/ක්‍රීඩිකාවන් සමත්වූහ. එහිදී, පහත සඳහන් විශේෂිත ජයග්‍රහණද ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් විසින් දිනාගන්නා ලදී.

**විවෘත කාන්තා කේවල තරඟාවලිය**

සෙ/20212796 ආකාසෙ නුෂාකා එච්ජ් - රෙම ශ්‍රීලයුකාබ

**විවෘත කාන්තා යුගල තරඟය - ශූරතාවය**

සෙ/20212792 ආකාසෙ විජේරත්න ඒබීඑම්එස් - රෙම ශ්‍රීලයුකාබ

සෙ/20212796 ආකාසෙ නුෂාකා එච්ජ් - රෙම ශ්‍රීලයුකාබ

**විවෘත පිරිමි කේවල තරඟය - ශූරතාවය**

සෙ/කේ100926 සාසෙ කරුණාතිලක වීඑම්ආර්එස් - රෙම ශ්‍රීලයුසේබ

**විවෘත පිරිමි යුගල තරඟය - ශූරතාවය**

සෙ/604121 කෝප්‍රල් කුමාර ටිඑච්ආර්පි - 1 ශ්‍රීලයුයුබ

සෙ/කේ100926 සාසෙ කරුණාතිලක වීඑම්ආර්එස් - 2 ශ්‍රීලයුසේබ



# ආරක්ෂක සේවා පාපන්දු තරඟාවලිය







ඉකුත් මැයි 22 වන දින කොළඹ 07 තුරඟ තරඟ පිටියේදී පවත්වන ලද ආරක්ෂක සේවා පාපන්දු තරඟාවලියේදී නාවික හමුදා පිරිමි කණ්ඩායම පරදා යුද්ධ හමුදා පිරිමි කණ්ඩායම ශූරතාව දිනාගැනීමට සමත්විය. එසේම, යුද්ධ හමුදා කාන්තා කණ්ඩායම එහි කාන්තා අනුශූරතාවය හිමිකරගැනීමට ද සමත්විය.

# ආරක්ෂක සේවා රගර් තරඟාවලිය - 2023





ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් සංවිධානය කරන ලද 12 වන "ආරක්ෂක සේවා රගර් තරඟාවලිය" පසුගිය මැයි 23 වන දින රත්මලාන ගුවන් හමුදා රග්බි ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. ඒ සඳහා යුද්ධ හමුදාව නියෝජනය කරමින් සහභාගී වූ ක්‍රීඩක/ක්‍රීඩිකාවෝ එහි කාන්තා කණ්ඩායම් ශුරතාවය සහ පිරිමි කණ්ඩායම අනුශුරතාවය දිනාගැනීමට සමත්වූහ.

# 12 වන ආරක්ෂක සේවා ක්‍රීඩා උලෙළේ පිහිනුම් ශූරතාවලියේ විශිෂ්ට දස්කම් යුද්ධ හමුදාවෙන්

මෙවර 12 වන ආරක්ෂක සේවා ක්‍රීඩා උලෙළ වැලිසර නාවික හමුදා පිහිනුම් තටාක සංකීර්ණයේදී පසුගිය ජූනි මස 5 සහ 6 යන දෙදින තුළ පැවැත්විණ. ඒ සඳහා ත්‍රිවිධ හමුදා පිහිනුම් කණ්ඩායම් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ විශාල පිරිසක් සහභාගී වූහ. එහිදී, රන් පදක්කම් 18 ක්, රිදී පදක්කම් 14 ක් සහ ලෝකඩ පදක්කම් 5 ක් දිනාගනිමින් පිරිමි අංශයේ පිහිනුම් ශුරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩකයෝ දිනාගත් අතර, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ පිහිනුම් ක්‍රීඩකයින් දෙවන හා තෙවන ස්ථානයන් හිමිකර ගත්හ. තරගාවලියේ දක්ෂතම පිහිනුම් ක්‍රීඩකයාට හිමි සම්මානය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ ලාන්ස් කෝප්‍රල් ෂෙහාන් බීඩී හිමිකර ගත්තේය.




තවද, යුද්ධ හමුදා කාන්තා පිහිනුම් ක්‍රීඩිකාවෝ රන් පදක්කම් 4 ක්, රිදී පදක්කම් 1 ක් සහ ලෝකඩ පදක්කම් 6 ක් දිනාගනිමින් තරඟාවලියේ කාන්තා අංශයේ අනුශුරතාවය හිමිකර ගත්හ. සමස්ත තරඟාවලියේ දී යුද්ධ හමුදාවේ පිහිනුම් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රන් පදක්කම් 22 ක් දිනාගැනීමට සමත්වීම කැපීපෙනේ. තරඟාවලියේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් වෙත සහතිකපත් ප්‍රදානය කිරීමේ අවස්ථාවට යුද්ධ හමුදා ජල ක්‍රීඩා කමිටුවේ උප සභාපති මේජර් ජෙනරාල් ඒසීඒ ද සොයිසා යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී සහභාගී විය.

# "*Road Race*" මැරතන් ඉසව්වේදී යුද්ධ හමුදාවෙන් විශිෂ්ට දස්කම්





12 වන ආරක්ෂක සේවා ක්‍රීඩා උලෙළේ '*Road Race*' මැරතන් ඉසව්ව ඉකුත් ජූනි මස 24 වන දින පැවැත්විණ. ඒ සඳහා සහභාගී වූ යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සුවිශේෂී ක්‍රීඩා කුසලතා ප්‍රදර්ශනය කරමින් සියලු අංශවලින් රන් පදක්කම් දිනාගත්හ. මෙවර ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සංවිධානය කරනු ලැබූ '*Road Race*' මැරතන් ඉසව්ව සඳහා ත්‍රිවිධ හමුදාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 60 කට අධික පිරිසක් සහභාගී වූහ. '*Road Race*' මැරතන් ඉසව්වේදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඒකල අංශයෙන් රන් පදක්කම් 02ක්, රිදී පදක්කමක් සහ ලෝකඩ පදක්කමක් දිනාගත් අතර පිරිමි සහ කාන්තා කණ්ඩායම් ඉසව් දෙකින්ම රන් පදක්කම් හිමිකර ගත්හ. මෙම මැරතන් ඉසව්ව උස්වැටකෙයියාව *Malima Club House* පරිශ්‍රයෙන් ආරම්භ වූ අතර තරඟය කිලෝමීටර් 21 ක දුරකින් යුක්ත විය.

# සුවසහන නිකේතනයට පරිත්‍යාගයක්



අභිමංසල 2 සුවසහන නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණසෙනියන්ගේ සුවදුක් විමසීම සඳහා පරිත්‍යාගශීලී සුජීව ද සිල්වා මහතා ඇතුළු පිරිසක් ඉකුත් ජූනි 06 වන දින සංචාරය කළහ. එම සංචාරයේදී පුනරුත්ථාපනලාභීන්ගේ ප්‍රයෝජනය සඳහා ජල පිරිපහදු යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමත්, ඔවුන් වෙත තේ පැන් සංග්‍රහයක් පිළිගැන්වීමත් සිදුකෙරිණ.

# "ප්ලාස්ටික් දූෂණයට විසඳුම්" පරිසර සංරක්ෂණ වැඩසටහන





මිහිඳුසෙන් මැදුර සුවසහන නිකේතනය සහ සියපත ෆිනෑන්ස් ආයතනය එක්ව එළැඹි ලෝක පරිසර දිනයට සමගාමීව 2023 ජූනි 05 වන දින ඖෂධ පැළ සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබීය. තවද, "ප්ලාස්ටික් දූෂණයට විසඳුම්" යන තේමාව යටතේ පරිසර සංරක්ෂණය හා පිරිසිදුතාවය කේන්ද්‍ර කරගනිමින් අත්තිඩිය ජලාශය සහ කුරුළු අභය භූමිය අවට පිරිසිදු කිරීමේ වැඩසටහනක් ද දියත් කෙරිණ. එම වැඩසටහන් මාලාව සඳහා සියපත ෆිනෑන්ස් ආයතනයේ කාර්ය මණ්ඩලය සහ මිහිඳුසෙන් මැදුර සුවසහන නිකේතනයේ සේනාවිධායක ඇතුළු කාර්ය මණ්ඩලයද නේවාසික පුනරුත්ථාපනලාභීන් ද සහභාගී වූහ.


# රණවිරුවා





අධීක්ෂණය

බ්‍රිගේඩියර්
කේඩබ්ලිව්එස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී



උපදේශකත්වය

ලුතිනන් කර්නල්
ආර්එම්ඩබ්ලිව්පීකේ රත්නායක



ප්‍රධාන සංස්කාරක

ලුතිනන් කර්නල්
සුජිත චමින්ද එදිරිසිංහ



සහය සංස්කාරක

කපිතාන්
එච්එල්යූ ලක්මිකා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම
සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්පිළිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර

ඊමේල්
dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන
011 2993076

යුධ දිලුව
51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

ප්‍රකාශනය
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# වැලි දූවිලි නැති නිදහස් රටක්...

යුද්දෙ තිබුණු තැන්වල හෙවන තිබුනෙ නැහැ වැලි දූවිලි නොතිබුණු තැන්වල යුද්දෙ තිබුනෙත් නැහැ රණවිරුවන්ගෙ වැඩිපුරම ලේ හැලුනෙ කාෂ්ටක අව්වට ගිනියම්වුණු මහපොළොවෙ. අවදානම වගේම ඒ පාරිසරික දුෂ්කරතාවනුත් දරාගෙන රට රකින එක ලේසි නෑ හැබැයි රණවිරුවො ඒ දේ කළා. ලේ නොහැලෙන වැලි දූවිලි නොනගින රටක් ඉතුරු කරල දුන්න. හමුදාව කියන්නෙ එහෙම ජාතියක්.




# ජීවිතය පිරික්සුම...

"යුදබිමේ පය ගහපු හැමතැනකම හිත්පිත් නැති පිපිරුමකට ඉඩක් තිබුනා. බෝම්බ එක්ක සෙල්ලම් කොයිතරම් භයානක වුණත්, අපේ රණවිරුවෝ දැන දැනම ඒ අවදානම ගත්තෙ අනික් අයට යන්න පාර හදල දෙන්නයි. අනුන්ගෙ ජීවිත වෙනුවෙන් තමන්ගෙ ජීවිත උකසට තිබ්බ පිරිසක් හිටියනම් ඒ රණවිරුවෝ විතරමයි."

